SRI LANKA
IMMIGRATION AND EMIGRATION

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
குடிவரவு, குடியகல்வுத் திணைக்களம்
Department of Immigration & Emigration

# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2016

# පටුන


| නාමාවලිය | | පිටුව |
|---|---|---|
| ✡ | හැඳින්වීම | 01 |
| ✡ | කාර්ය මණ්ඩල තොරතුරු | 02 |
| ✡ | දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | 03 |
| 01. | පාලන අංශය | 04 |
| 01.1 | පාලන ශාඛාව | 04 |
| 01.2 | පුහුණු හා සංවර්ධන ශාඛාව | 05 |
| 01.3 | ප්‍රසම්පාදන ශාඛාව | 08 |
| 02. | ගමන් බලපත්‍ර අංශය | 10 |
| 02.1 | ගමන් බලපත්‍ර ශාඛාව | 10 |
| 02.2 | ගමන් බලපත්‍ර සැකසීමේ ශාඛාව | 13 |
| 02.3 | ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව | 14 |
| 02.4 | විදේශ දූත මණ්ඩල ශාඛාව | 17 |
| 02.5 | තැපැල් ශාඛාව | 19 |
| 03. | ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය | 21 |
| 03.1 | ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව | 21 |
| 03.2 | ඉන්දු ලංකා පුරවැසි ශාඛාව | 24 |
| 03.3 | නීති ශාඛාව | 25 |
| 04. | වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය | 27 |
| 04.1 | වීසා ශාඛාව | 27 |
| 04.2 | තොටුපල ශාඛාව | 31 |
| 04.3 | විමර්ශන ශාඛාව | 41 |
| 05. | තොරතුරු තාක්ෂණ අංශය | 43 |
| 06. | ගිණුම් අංශය | 45 |
| 07. | පුරවැසි අංශය | 49 |
| 08. | අභ්‍යන්තර විගණන අංශය | 53 |
| 09. | සුබසාධන කටයුතු | 55 |

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## කාර්ය සාධන වාර්තාව - 2016

## හැඳින්වීම

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතෙහි විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුල්වීම පාලනය කිරීම සඳහාත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන වෙනත් පුරවැසියන් හා තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම සඳහාත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම සඳහාත් කටයුතු කිරීමේ බලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුවේ. ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම, විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ දරුවන් සඳහා මෙරට පුරවැසිභාවය ලබා දීම මෙන්ම ශ්‍රී ලාංකික පුරවැසිභාවය ඉල්ලුම් කරන ශ්‍රී ලාංකික නොවන තැනැත්තන් සඳහා මෙරට පුරවැසිභාවය ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

### දැක්ම

❖ කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම.

### මෙහෙවර

❖ ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින්, රටින් බැහැර වන්නන් හා ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම.

### කාර්යභාරය

ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අනුශාංගික කාර්යයන්

විදේශීකයින් සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අනුශාංගික කාර්යයන්

ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ කටයුතු

ප්‍රත්‍යාන්ත පාලනය

සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය පරිපාලනය

### නෛතික අධිකාරිය

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1948 අංක 18 දරන පුරවැසි පනත හා එහි සංශෝධන
- 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සහ ඊට අදාළ සංශෝධන
- 1949 අංක 03 දරන ඉන්දියානු හා පකිස්තානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත
- 1956 ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාළ සංශෝධන
- 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත (සිරිමා ශාස්ත්‍රීය ගිවිසුම )
- 1988 අංක 39 දරන ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රධානය කිරීමේ පනත
- 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රධානය කිරීමේ පනත
- ඉහත පනත් වලට අදාළ සියලුම රෙගුලාසි හා නියෝග
- පාලක ජනරාල් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්


## කාර්ය මණ්ඩල තොරතුරු

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම ගණන් දීමේ නිලධාරියා වශයෙන් පාලක ජනරාල්වරයා වෙත වගකීම පැවරෙන අතර , ඔහුගේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ අතිරේක පාලක ජනරාල්වරයෙකු , පාලකවරුන් 05 දෙනෙකු , ප්‍රධාන ගණකාධිකාරීවරයෙකු හා අභ්‍යන්තර විගණකවරයකු වෙත ඒ ඒ අංශවල වගකීම් පැවරී ඇත.

| අනු අංකය | තනතුර | සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | පාලක ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ) | 1 | 1 | - |
| 2 | අතිරේක පාලක ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ) | 1 | 1 | - |
| 3 | පාලක | ශ්‍රී.ලං.ප.සේ | 5 | 5 | - |
| 4 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | 1 | 1 | - |
| 5 | නියෝජ්‍ය/සහකාර පාලක | ශ්‍රී.ලං.ප.සේ | 39 | 33 | 6 |
| 6 | නියෝජ්‍ය/සහකාර පාලක | දෙපා. | 10 | 7 | 3 |
| 7 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | 2 | 2 | - |
| 8 | අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | 1 | 1 | - |
| 9 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ | 2 | 2 | - |
| 10 | ජ්‍යෙ.බලයලත් නිල. (දෙපා.) | දෙපා. | 36 | 14 | 22 |
| 11 | බලයලත් නිලධාරී (දෙපා.) | දෙපා. | 358 | 331 | 27 |
| 12 | භාෂා පරිවර්ථක | භාෂා පරි.සේවය | 2 | 2 | - |
| 13 | පුහුණු කළමනාකරු | ආශ්‍රිත සේවා | 1 | 1 | - |
| 14 | අයවැය සහකාර | ආශ්‍රිත සේවා | 1 | 1 | - |
| 15 | සංවර්ධන නිලධාරී | සං.නිල.සේවය | 20 | 20 | - |
| 16 | නියාමක | දෙපා. | 3 | 3 | - |
| 17 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | 368 | 368 | - |
| 18 | පිළිගැනීමේ නිලධාරී (දෙපා.) | දෙපා. | 1 | 1 | - |
| 19 | ගමන් බලපත්‍ර සහායක | දෙපා. | 35 | 31 | 4 |
| 20 | රියදුරු | රියදුරු සේවය | 30 | 30 | - |
| 21 | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ | 104 | 103 | 1 |
| 22 | කම්කරු පුහුණුවන | අනියම් | 10 | 5 | 5 |
| | එකතුව | | 1031 | 963 | 68 |

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ

## සංවිධාන ව්‍යූහය



# 01 .පාලන අංශය

පාලක (පාලන) ගේ අධීක්ෂණය මත සාමාන්‍ය පරිපාලන කටයුතු, පුහුණු හා මානව සංවර්ධන කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු මෙම අංශයේ ක්‍රියාත්මක වේ.

## 01:1 පාලන ශාඛාව

**කාර්ය මණ්ඩලය**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 02 |
| පරිපාලන නිලධාරි | 01 |
| භාෂා පරිවර්තක | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 27 |
| රියදුරන් | 30 |
| කාර්යාල සේවකයින් | 04 |
| කම්කරුවන් | 05 |

## ආයතනික කටයුතු

**බඳවා ගැනීම් සහ උසස් කිරීම්**

| තනතුර | සංඛ්‍යාව | උසස්වීම ලද තනතුර |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි | 01 | සහකාර පාලක (2016.06.13) |
| රාජ්‍ය කළමනාකරණ සහකාර I | 06 | රා. ක. ස. අධිශ්‍රේණිය |
| රාජ්‍ය කළමනාකරණ සහකාර II | 02 | රා. ක.ස. I |
| රාජ්‍ය කළමනාකරණ සහකාර III | 25 | රා. ක. ස. II |

**සේවයේ ස්ථිර කිරීම්**

කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ නිලධාරීන් 3

**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ**

බලයලත් නිලධාරීන්ගේ 2016 වර්ෂය සඳහා වන කඩඉම් පරීක්ෂණය 2017.03.19 දින පවත්වන ලදි.

**ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ගැනීම් - 2016**

| තනතුර | දෙපාර්තමේන්තුවට පැමිණි සංඛ්‍යාව | පිටතට ස්ථාන මාරුවූ | විශ්‍රාම ලැබූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 08 | 12 | - |
| සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) | - | - | 2 |
| බලයලත් නිලධාරි | - | - | 2 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 98 | 50 | 11 |
| කාර්යාල කාර්ය සහායක සේවය | 13 | - | 3 |
| රියදුරු සේවය | 03 | - | 1 |

**විනය කටයුතු**

ආරම්භ කර ඇති මූලික විමර්ශණ සංඛ්‍යාව - 05
අවසන් කර ඇති මූලික විමර්ශණ සංඛ්‍යාව - 01
ආරම්භ කර ඇති විධිමත් විනය පරීක්‍ෂණ සංඛ්‍යාව - 0
අවසන් කර ඇති විධිමත් විනය පරීක්‍ෂණ සංඛ්‍යාව - 0
වැඩ තහනම් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව - 01
සේවයෙන් ඉවත් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව - 0

## 01.2 පුහුණු හා සංවර්ධන ශාඛාව

පාලක (පාලන) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| පුහුණු කළමනාකරු | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 03 |
| කාර්යාල සේවකයින් | 01 |

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඊට ගැලපෙන පරිදි මානව සම්පත් සංවර්ධන වැඩසටහන්,

- සැළසුම් කිරීම
- සංවිධානය කිරීම
- ක්‍රියාත්මක කිරීම
- අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
- විදේශීය පුහුණුවීම් අවස්ථාවන් හඳුනාගනිමින් ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීම
- පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ප්‍රතිපාදනයන්ට අමතරව බාහිර ආයතන හා තානාපති කාර්යාල , ජාත්‍යන්තර සංවිධාන හරහා කාර්යය මණ්ඩල පුහුණු අවස්ථාවන් හඳුනාගනිමින් ඒ හා අදාළ කාර්යයන් ඉටුකිරීම.

**2016 වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන්**

| වැඩමුළු පැවැත් වූ දින | වැඩමුළුව | පවත්වනු ලැබුවේ කවුරුන් වෙනුවෙන්ද? | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 2016.01.04<br>2016.01.08 | නවක නිලධාරීන් සඳහා නම්නීකරණ වැඩමුළුව<br>(පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | මාණ්ඩලික නිලධාරීන්,<br>කළමනාකරණ සහකාර නිලධාරීන්,<br>කාර්යාල කාර්ය සේවකයන් සඳහා | 40 |
| 2016.01.23 | ජෛවමිතික ගමන් බලපත් ව්‍යාපෘතියේ ප්‍රගතිය සාකච්ඡා කිරීම පිළිබඳ වැඩමුළුව | මාණ්ඩලික නිලධාරීන් | 24 |
| 2016.01.25 | ක්‍රීඩා හා ශාරීරික සුවතා ප්‍රවර්ධන විශේෂ ක්‍රියාත්මක කිරීම.<br>ක්‍රීඩා හා ව්‍යායාම පිළිබඳ ප්‍රායෝගිකව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>(පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | සියලුම නිලධාරින් | 300 |
| 2016.02.10 | Training program on fingerprint feature identification and ICAO photo standard Compliance | SLAS Officers, Authorized Officers | 30 |
| 2016.02.17 | Workshop on Readmission (Hotel Renuka) | Senior Authorized Officers | 17 |

| | | | |
|---|---|---|---|
| 2016.02.24 | Case Management System RCMS (Hotel Renuka) | Senior Authorized Officers | 17 |
| 2016.03.03 | කයිසෙන් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | සහකාර පාලක, කළමනාකරණ සහකාර නිලධාරීන්, කාර්යාල කාර්ය සේවකයන් සඳහා | 50 |
| 2016.03.09 | ආගමන හා විගමන ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්ට හා බලයලත් නිලධාරීන් සඳහා ලියවිලි පරීක්ෂාව පිළිබඳ වැඩමුළුව (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්, බලයලත් නිලධාරීන් | 26 |
| 2016.03.19 | ගමන් බලපත් අංශයේ රාජකාරී කටයුතු පිළිබඳ විශේෂ වැඩමුළුව (අපේ ගම පරිශ්‍රය) | නියෝජ්‍ය පාලක, සහකාර පාලක | 35 |
| 2016.04.05<br>2016.04.08 | අල්ලස් හෝ දූෂණ සම්බන්ධ නිවාරණව පිළිබඳ පුහුණු වැඩසටහන (කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපල විවේකාගාර ශ්‍රවනාගාරය) | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් | 85 |
| 2016.04.26<br>2016.04.29 | නවක නිලධාරීන්ගේ නම්නීකරණ වැඩමුළුව | කළමනාකරණ සහකාර නිලධාරීන්, කාර්යාල කාර්ය සේවකයන් සඳහා | 25 |
| 2016.04.31 | ධනාත්මක චින්තනය , ප්‍රත්‍යන්ත පාලන හා වීසා කටයුතු සහ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ මාණ්ඩලික නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුව (ශ්‍රී ලංකා පදනම් ආයතනය) | මාණ්ඩලික නිලධාරීන් | 50 |
| 2016.05.11 | රාජ්‍ය ලේඛන කළමනාකරණය සුරක්ෂිතභාවය සංරක්ෂණය හා අපහරණය සඳහා වැඩමුළුව | මාණ්ඩලික නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන්, කාර්යාල කාර්ය සේවකයන් | 60 |
| 2016.06.09 | ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන | මාණ්ඩලික නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කාර්යාල කාර්ය සේවකයන් සඳහා | 40 |
| 2016.06.14<br>2016.09.06 | ඵලදායීතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දින 12) | කළමනාකරණ සහකාර නිලධාරීන් | 03 |
| 2016.06.20 | මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතාවේ අනිසි ප්‍රතිවිපාක හා සමාජ බලපෑම් - පිළිකා වැඩමුළුව (පියස පරිශ්‍රය) | සියළුම නිලධාරින් | 80 |
| 2016.06.22 | ඵලදායීතා වැඩසටහන | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්,කළමනාකරණ සහකාර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කාර්යාල කාර්ය සේවකයන් සඳහා | 20 |
| 2016.07.08 | මහජන සම්බන්ධතාව හා නායකත්ව පිළිබඳ වැඩමුළුව (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | මාණ්ඩලික නිලධාරීන් | 45 |

| | | | |
|---|---|---|---|
| 2016.07.13 | අල්ලස් හෝ දූෂණ සම්බන්ධ නිවාරණ වැඩසටහන (ආගමන විගමන දෙපාර්තමේන්තු විවේකාගාරය කටුනායක) | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරින් බලයලත් නිලධාරින් | 85 |
| 2016.07.25 | පරිපාලනමය රෙගුලාසි හා ඒවායේ ප්‍රායෝගික භාවිතය, අභියෝග හා අවදානම (රේණුකා හෝටලය) | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරින් | 25 |
| 2016.07.26<br>2016.08.05 | Strengthening the government capacity to combat human smuggling & other cross border crimes in Sri Lanka<br>(Hotel Renuka) | Senior Immigration Officers/ Immigration Officers | 25 |
| 2016.07.27<br>2016.08.03 | Travel documents (training and development unit) | Senior Immigration Officers/ Immigration Officers | 25 |
| 2016.07.29<br>2016.08.05 | Inland Immigration Enforcement (Hotel Renuka) | Senior Immigration Officers/ Immigration Officers | 20 |
| 2016.10.28 | Finger Print Science | Executive Officers | 15 |
| 2016.11.01 | තත්ත්ව කව හා තත්ත්ව පාලන මෙවලම් පුහුණු වැඩමුළුව | මාණ්ඩලික නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කාර්යාල කාර්ය සේවකයන් | 35 |
| 2016.11.09 | Investigation of Narcotics (Department of Immigration & Emigration) | Senior Authorized Officers & Authorized Officers | 20 |
| 2016.11.10<br>2016.11.11 | 2016.05.15 දිනෙන් පසු දෙපාර්තමේන්තුවට පැමිණි නවක නිලධාරී නම්නිකරණ වැඩමුළුව | කළමනාකරණ සහකාර නිලධාරීන්, කාර්යාල කාර්ය සේවකයන් සඳහා | 15 |
| 2016.11.28<br>–<br>2016.12.09 | කැනේඩියානු තානාපති කාර්යාල නිලධාරින් විසින් පවත්වන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව | බලයලත් නිලධාරින් | 15 |
| 2016.12.02 | Visa and Boarder Management Formalities /Procedures and operations<br>(Excel of Distance Learning Center) | Executive Officers | 45 |
| 2016.12.03 | ප්‍රත්‍යන්ත පාලන හා වීසා කටයුතු පිළිබඳ විශේෂ වැඩමුළුව<br>(ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය) | මාණ්ඩලික නිලධාරීන් | 50 |
| 2016.12.05<br>2016.12.09 | Outbound Training<br>Outside Colombo – Canadian Council | Authorized Officers | 25 |

| | | | |
|---|---|---|---|
| 2016.12.10 | ප්‍රත්‍යන්ත පාලන හා වීසා කටයුතු පිළිබඳ විශේෂ වැඩමුළුව කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපල රාජකාරී ඉටුකිරීම සම්බන්ධයෙන් ආගමන හා විගමන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව | බලයලත් නිලධාරින් | 20 |
| 2016.12.17<br>2016.12.18 | ගමන් බලපත් නිකුත් කිරීමේ නව ක්‍රමවේදයේ ප්‍රවනතාවන් පරිපාලනමය කටයුතුවල යාවත්කාලීනවීම් | ප්‍රාදේශීය කාර්යාලවල සියළුම නිලධාරින් | 60 |

## 01.3 ප්‍රසම්පාදන ශාඛාව

2016 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව සිදු කරන ලද කාර්යන් වල ප්‍රගතිය.

| ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩ | භාණ්ඩවල වටිනාකම (රු.) |
|---|---|
| කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ | 42,530,154,23 |
| මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර | 1,340,192.00 |
| පරිගණක පද්ධතියට අදාල උපකරණ | 122,223,977.73 |
| ස්කෑනර් යන්ත්‍ර | 1,058,400.00 |
| හිස් ගමන් බලපත්‍ර සහ ඊට අදාල මුද්‍රණ කටයුතු සඳහා තීන්ත | 549,176,629.39 |
| ගොඩනැගිලි ඉදිකිරීම් හා එකතු කිරීම් | 86,769,383.05 |
| වීසා ස්ටිකර් | 13,423,375.00 |
| උත්සව සහ වෙනත් සංවිධාන කටයුතු | 8,899,413.70 |
| ලියකියවිලි ස්කෑන් කිරිම | 1,689,120.00 |
| **එකතුව** | **827,110,645.10** |

<u>විශේෂිත කාර්යන්</u>

**1. කාර්ය මණ්ඩල අභිප්‍රේරණය සඳහා**

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීමේ පියවරක් ලෙස 2016 වසරේ කාර්ය සාධනය පදනම් කරගෙන විශිෂ්ඨ නිලධාරීන් සඳහා සහතික, ප්‍රශංසා සහ ත්‍යාග පිරිනමන ලදී. ත්‍යාග සඳහා දෙපාර්තමේන්තු සුබසාධක සංගමයේ අනුග්‍රහය ලබාදෙන ලදී. එක් එක් සේවා බණ්ඩ අනුව විශිෂ්ඨ නිලධාරීන් ලෙස තෝරාගන්නා ලද නිලධාරීන් සංඛ්‍යාව පහත සඳහන් වේ.

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ජොෂ්ඨ බලයලත් නිලධාරී | 01 |
| බලයලත් නිලධාරී | 06 |
| ගමන් බලපත් සහායක | 02 |
| කළමනාකරණ සහකාර | 07 |
| කාර්යාල කාර්ය සහයක | 04 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රියදුරු | 01 |

## 2. දෙපාර්තමේන්තුව නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම.

දෙපාර්තමේන්තුව අංක 41, ආනන්ද රාජකරුණා මාවත , කොළඹ 10 යන ස්ථානයේ පෞද්ගලික සමාගමකට අයත් ගොඩනැගිල්ලක කුලී පදනම මත පවත්වාගෙන ගිය අතර 2016.08.29 දින දෙපාර්තමේන්තුව බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කරන ලදී.

එහිදී "සුහුරුපාය" නව ගොඩනැගිල්ල තුළ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම හා වර්ථමාන සේවා ස්ථානය පිහිටා ඇති ගොඩනැගිල්ල හිමිකරු වෙත භාරදීම දක්වා විශාල කාර්යභාර්යයන් දෛනික රාජකාරී අතරතුර සිදු කරන ලදී.

තොරතුරු තාක්‍ෂණය උපයෝගී කර ගනිමින් පරිගණක පද්ධති ක්‍රමයක් මඟින් දෛනිකව සේවා සපයනු ලබන මෙම දෙපාර්තමේන්තුව නව ගොඩනැගිල්ලක් තුළ ස්ථාපිත කිරීම අභියෝගාත්මක කර්යභාරයක් වූ නමුත් රජයේ වැඩ කරන එක් දිනක් පමණක් කාර්යාලය වසාදමා නව ගොඩනැගිල්ල තුළ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සියලුම නිලධාරීන්ගේ සහභාගීත්වය මත සිදු කරන ලදී.

## 3. වැඩ අධ්‍යනයක් කිරීම.

දෙපාර්තමේන්තු කාර්ය භාරයේ ප්‍රසාරණය හා නව කාර්ය භාර්යන් එකතුවීම තුළ මානව සම්පත් උපයෝජනයේ ස්වභාවය අධ්‍යනය කර අවශ්‍ය ප්‍රතිව්‍යුහයන් සිදු කිරීමේ අරමුණ ඇතිව වැඩ අධ්‍යනයන් සිදු කිරීම ආරම්භ කරන ලදී.

# 2. ගමන් බලපත්‍ර අංශය

පාලක (ගමන් බලපත්‍ර) යටතේ ප්‍රධාන වශයෙන් ගමන් බලපත්‍ර අංශය, ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව, ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව, විදේශ දූත මණ්ඩල ශාඛාව හා තැපැල් ශාඛාව ක්‍රියාත්මක වේ.

## 02 : 1 ගමන් බලපත්‍ර ශාඛාව

මෙම දෙපාර්තමේන්තුවේ සේවය ලබා ගැනීමට මහජනයා වැඩිපුරම පැමිණෙන අංශය ගමන් බලපත්‍ර ශාඛාව වේ. විදේශ රැකියා, සංචාර, වෛද්‍ය ප්‍රතිකාර ආදී විවිධ වූ අවශ්‍යතාවයන් මත ගමන් බලපත්‍ර අයදුම්කරන අයදුම්කරුවන් වෙත ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත නිවැරදි තොරතුරු ඇතුලත් ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම මෙම ශාඛාවෙන් සිදු කරයි. ප්‍රධාන කාර්යාලයේ ගමන් බලපත්‍ර ශාඛාවට අමතරව මහනුවර, වවුනියාව හා මාතර ලෙස ප්‍රාදේශීය කාර්යාල 03ක් පිහිටුවා ඇති අතර, 2015 වසරේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගමන් බලපත්‍ර අයදුම්පත් භාරගැනීම අත්හිටුවන ලදී.

මෙම ශාඛාව පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 16 |
| සංවර්ධන නිලධාරීන් | 07 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 56 |
| කාර්යාල සේවකයින් | 18 |

### ගමන් බලපත් අංශයේ අරමුණු

විදේශ රැකියාවක් සඳහා සංචාරය සඳහා වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආදී විවිධාකාර වූ අවශ්‍යතාවයන් මත විදේශ ගමන් බලපත් අයදුම් කරන අයදුම්කරුවන් වෙත ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත නිවැරදි තොරතුරු අතුළත් විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම.

### කාර්යභාරය

සේවා ලභී ජනතාවගේ උපරිම පහසුව පිලිබඳ සංවේදී වන ක්‍රියාවලියක් අනුගමනය කරමින් විදේශ ගතවන ශ්‍රී ලාංකිකයන් සඳහා ගමන් බලපත්‍ර නිකුත් කිරීම.

## 2016 වර්ෂයේ තුළ ඉටුකරන ලද විශේෂිත කාර්යයන්

ගමන් බලපත්ලාභින්ගේ ජෛවමිතික දත්ත ලබාගැනීමේ ව්‍යාපෘතිය තුල අත්විදි යම් යම් තාක්ෂණික හා ප්‍රායෝගික දුෂ්කරතා මධ්‍ය යේ වුවද දෙපාර්තමේන්තුවේ නව කාර්යාල පරිශ්‍රය තුල පාරිභෝගික සේවා අත්හිටුවීමේ කාලපරිච්ඡේදයන් රහිතව විදේශ ගමන් බලපත් අංශය ස්ථාපිත කිරීම.

### ජයග්‍රහණ

ජෛවමිතික ගමන් බලපත් නිකුත් කිරිමේ ක්‍රියාවලිය යටතේ අයදුම්කරුවන් වෙතින් ලබාගත් ඇගිලි සලකුණු සංසන්ධනය කිරීමේ ක්‍රියාවලිය (Biometric Project Phase) සාර්ථකව දියත් කරන ලදී.

### අභියෝග

01. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ නිර්ණායකයන්ට පූර්ණ ලෙස ගැලපෙන පුද්ගල ඡායාරූප මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට ලබා ගැනීම, ඇගිලි 10 යේම ඇගිලි සලකුණු ලබා ගැනීම, උපරිම පාරිභෝගික සේවා පහසුව , මනා පිරිස් හැසිරිම යන අංග තෘප්ත වන පරිදි සඵලදායි විදේශ ගමන් බලපත් නිකුත් කිරිමේ ක්‍රියාවලියක් නව දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල ක්‍රියාත්මක කිරීම.

02. ජාත්‍යන්තර වඩා පිළිගත් නව තාක්ෂණික හා ආරක්ෂිත උපාංග වලින් සමන්විත විදේශ ගමන් බලපත්‍රයක් හඳුන්වා දීම.

## ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය - 2016

### ප්‍රධාන කාර්යාලය

| රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|
| 401 | 1,846 | 355,317 | 177,452 | 23,398 | 12 | **558,426** |

### ප්‍රාදේශීය කාර්යාල

| | රාජකාරී | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික (දඹදිව යාම) | එකතුව |
|---|---|---|---|---|---|
| **මහනුවර** | 8 | 32,158 | 12,861 | 6,900 | **51,927** |
| **වවුනියාව** | 1 | 15,558 | 5,868 | 817 | **22,244** |
| **මාතර** | 1 | 19,361 | 4,130 | 2,636 | **26,128** |


## 2016 වර්ෂයේ නිකුත් කරන ලද සියළුම ගමන් බලපත්‍ර සංඛ්‍යාව

| රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|
| **401** | **1,856** | **422,394** | **200,311** | **33,751** | **12** | **658,725** |

## 2012 සිට 2016 දක්වා ගමන් බලපත්‍ර නිකුත් කිරීම් (ගමන් බලපත්‍ර වර්ග අනුව)

| වර්ෂය | රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2012 | 288 | 899 | 303,524 | 230,482 | 35,697 | 4 | 570,894 |
| 2013 | 338 | 998 | 284,231 | 214,352 | 17,611 | 6 | 517,536 |
| 2014 | 309 | 1,043 | 234,943 | 198,815 | 14,786 | 6 | 449,902 |
| 2015 | 471 | 1313 | 287,438 | 176,963 | 25,180 | 2 | 491,367 |
| 2016 | **401** | **1,856** | **422,394** | **200,311** | **33,751** | **12** | **658,725** |

## 2012 සිට 2016 දක්වා ගමන් බලපත්‍ර නිකුත් කිරීම්



## 02 : 2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව

පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

ගමන් බලපත්‍ර ශාඛාවෙන් සහ විදේශ දූත මණ්ඩල ශාඛාවෙන් නව ගමන් බලපත්‍ර සකස් කිරීම සඳහා සැකසුම් ශාඛාව වෙත යොමුවන අයදුම්පත්‍ර අදාල පරීක්ෂාකිරීම් වලින් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරනු ලබයි.

දත්ත ඇතුලත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate), ඡායාරූප හා අත්සන් පරිලෝඛණය කිරීම (Capture), මුද්‍රණය කිරීම (Print), මුද්‍රණය කරන ලද ගමන් බලපත්‍ර වල වෙනස් කිරීම් සහ නිරීක්ෂණ ඇතොත් ඒවා 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print), තත්ව පාලනය කිරීම (Quality Assurance), ගමන් බලපත්‍ර ලැමිනේටින් කිරීම, පරීක්ෂා කිරීම, සැසඳීම හා 4 වන පිටුව ස්කෑන් කිරීම (Compare & 4th Page Scan) සහ අවසාන තත්ව පරීක්ෂාව (Quality Control) සිදුකර ඉන් අනතුරුව එක්දින සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත්‍ර ගමන් බලපත්‍ර ශාඛාවටත්, සාමාන්‍ය සේවා යටතේ නිකුත් කරන ගමන් බලපත්‍ර තැපැල් ශාඛාවටත්, විදේශ දූත මණ්ඩල වලට යැවිය යුතු ගමන් බලපත්‍ර විදේශ දූත මණ්ඩල ශාඛාවටත් යවනු ලබයි.

සංශෝධන ශාඛාවෙන් ගමන් බලපත්‍ර සංශෝධන කටයුතු සඳහා යොමු කරන අයදුම්පත්‍ර අදාල පරීක්ෂාකිරීම් වලින් අනතුරුව දත්ත ඇතුලත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate) හා සංශෝධන 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print) සිදු කරනු ලබයි.

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 02 |
| සහකාර පාලක | 01 |
| සංවර්ධන නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 53 |
| ගමන් බලපත්‍ර සහායක නිලධාරීන් | 18 |
| කාර්යාල සේවකයින් | 10 |

## 02 : 3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 06 |
| කාර්යාල සේවකයින් | 02 |

### ගමන් බලපත්‍ර සංශෝධනය - 2016


| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| සියලු රටවල් සඳහා වලංගු කිරීම | 390 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 2053 |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුලත් කිරිම | 376 |
| ළමයින් ගමන් බලපත්‍රයෙන් ඉවත් කිරීම | 2310 |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 4209 |
| විවාහයට පෙර නම යෙදීම | 255 |
| නම වෙනස් කිරීම | 4038 |
| විවාහයට පසු නම යෙදීම | 1668 |
| වෙනත් සංශෝධන(ගාස්තු රහිත) | 01 |
| වෙනත් සංශෝධන 01 | 15814 |
| වෙනත් සංශෝධන 02 | 224 |
| වෙනත් සංශෝධන 03 | 2 |
| නම මාරුකිරීම(වෙනත්) | 3 |
| තනතුර සටහන් කිරීම | 39629 |
| කාලය දීර්ඝ කිරීම | 346 |
| **එකතුව** | **71318** |

## ගමන් බලපත්‍ර සංශෝධනය (2012 සිට 2016 දක්වා)

| වර්ගය | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| සියලු රටවල් සඳහා වලංගු කිරීම | 1,496 | 2,557 | 473 | - | 390 |
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | 667 | 541 | - | 397 | - |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 1,264 | 1,309 | 1151 | 1289 | 2053 |
| කාලය දීර්ඝ කිරීම | 28,740 | 10,384 | 2,368 | - | - |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුලත් කිරිම | - | - | 11 | 209 | 376 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයට ළමයින් ඇතුළත් කිරීම | 2,207 | 1,856 | 1496 | 794 | - |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයෙන් දරුවන් ඉවත් කිරීම | 2,656 | 2,361 | 2219 | 2190 | 2310 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයට දරුවන්ගේ අළුත් ඡායාරූප ඇතුළත් කිරීම | 93 | 137 | 135 | 47 | - |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 1,496 | 1,671 | 2070 | 2003 | 4209 |
| විවාහයට පෙර නම යෙදීම | 34 | 40 | 16 | 48 | 255 |
| විවාහයට පසු නම යෙදීම | 2,224 | 2,036 | 2033 | 1898 | 1668 |
| නම වෙනස් කිරීම | 3,984 | 3,399 | 3119 | 3265 | 4038 |
| නම මාරුකිරීම(වෙනත්) | 2 | 7 | 3 | 2 | 3 |
| තනතුර සටහන් කිරීම | 47,347 | 55,655 | 66,922 | 54400 | 39629 |
| තනතුර සටහන් කිරීම(ගාස්තු රහිත) | 2 | 2 | - | 880 | - |
| වෙනත් සංශෝධන(ගාස්තු රහිත) | 137 | 151 | 81 | 9 | 1 |
| වෙනත් සංශෝධන 01 | 33,316 | 27,462 | 28,669 | 20844 | 15814 |
| වෙනත් සංශෝධන 02 | 1,363 | 995 | 913 | 330 | 224 |
| වෙනත් සංශෝධන 03 | 28 | 27 | 17 | 7 | 2 |
| අලුත්කිරිම් | - | - | - | - | 346 |
| **එකතුව** | **127,056** | **110,590** | **111,696** | **88612** | **71318** |

දෙමාපියන්ගේ ගමන් බලපත්‍ර සඳහා ළමුන් ඇතුලත් කිරීම 2015.08.10 දිනෙන් පසුව නවතා ඇත. ඒ අනුව එදිනෙන් පසු වයස් භේදයකින් තොරව සෑම කෙනෙකුම වෙනම ගමන් බලපත්‍රයක් ලබා ගත යුතුය.

**ගමන් බලපත්‍ර සංශෝධනය (2012 සිට 2016 දක්වා)**



## 02 : 4 විදේශ දූත මණ්ඩල ශාඛාව

පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 01 |
| සංවර්ධන නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 15 |
| ගමන් බලපත්‍ර සහායක | 01 |
| කාර්යාල සේවකයින් | 04 |

### 1. විදේශ දූතමණ්ඩල අංශයේ අරමුණ හා කාර්යභාරය

* . විදේශ දූතමණ්ඩල වලින් ලැබෙන අයදුම්පත් වලට අදාල ගමන්.බලපත් නිකුත් කිරීම.

* තාවකාලික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට සහ විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ගමන් බලපත් වල සංශෝධන සඳහා අනුමැතිය ලබාදීම.

*විදේශ දූතමණ්ඩල විසින් ඉල්ලා ඇති අවස්ථාවල විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ගමන් බලපත් වලට අදාල නිරවද්‍යතාවය තහවුරු.කරමින් වාර්තා ලබා දීම.

### 11. 2016 වර්ෂය තුල ඉටුකරන ලද විශේෂිත කාර්යයන් , ජයග්‍රහන හා අභියෝග

ඉහත අරමුණු හා කාර්යයන් ඉටුකිරිමට අදාලව විශේෂිත කාර්යයන් නොපිරිහෙලා ඉටුකිරිම.


2016 වර්ෂය තුල මෙම අංශය මගින් නිකුත් කරන ලද ගමන් බලපත් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**මෙම ශාඛාව මගින් නිකුත් කරන ලද ගමන් බලපත්‍ර - 2016**

| මාසය | සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 2848 |
| පෙබරවාරි | 2049 |
| මාර්තු | 3783 |
| අප්‍රේල් | 4788 |
| මැයි | 5229 |
| ජුනි | 4491 |
| ජූලි | 3271 |
| අගෝස්තු | 4562 |
| සැප්තැම්බර් | 3485 |
| ඔක්තෝම්බර් | 3322 |
| නොවැම්බර් | 3673 |
| දෙසැම්බර් | 3021 |
| එකතුව | 44522 |

<u>2012 වසර සිට 2016 වසර දක්වා නිකුත් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳ විස්තර</u>

| මාසය | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 2813 | 2117 | 2829 | 2027 | 2848 |
| පෙබරවාරි | 1731 | 2225 | 3312 | 3152 | 2049 |
| මාර්තු | 3752 | 3329 | 3768 | 3551 | 3783 |
| අප්‍රේල් | 3426 | 3298 | 3446 | 4082 | 4788 |
| මැයි | 3785 | 3219 | 2921 | 3052 | 5229 |
| ජූනි | 3770 | 4256 | 3346 | 3573 | 4491 |
| ජූලි | 3169 | 3271 | 3858 | 3497 | 3271 |
| අගෝස්තු | 2956 | 1027 | 3329 | 3951 | 4562 |
| සැප්තැම්බර් | 2609 | 3524 | 3297 | 3307 | 3485 |
| ඔක්තෝම්බර් | 3343 | 3015 | 3632 | 3112 | 3322 |
| නොවැම්බර් | 2610 | 3918 | 2010 | 1833 | 3673 |
| දෙසැම්බර් | 2721 | 2512 | 4080 | 1908 | 3021 |
| **එකතුව** | **36,685** | **35,711** | **39,828** | **37,045** | **44,522** |




**2016 වර්ෂයේ ඉලක්ක හා ප්‍රගතිය**

ඉහත අරමුණු හා ඉලක්ක වලට අදාල කාර්යයන් අංශයේ සියළුම දෙනාගේ කැපවීම මත අප්‍රමාදව ප්‍රශස්ත මට්ටමින් ඉටු කිරීම.

## 02 : 5 තැපැල් ශාඛාව

සාමාන්‍ය සේවය යටතේ භාර දී ඇති ඉල්ලුම්පත්‍ර වලට අදාල ගමන් බලපත්‍ර සකසා අවසන් වූ පසු අයදුම්කරුවන්ගේ ලිපිනයන් වෙත ලියාපදිංචි තැපැල් මගින් යැවීම හා සාමාන්‍ය සේවය යටතේ භාර දී ඇති ඉල්ලුම්පත්‍ර වලට අදාල ගමන් බලපත්‍ර කඩිනම් කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් වලදී “එදින නිකුත් කිරීම්” ක්‍රමය යටතේ සකස්කර භාර දීම මෙම ශාඛාවේ ප්‍රධාන කාර්යය වේ.

පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2016**


| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 08 |
| නියාමක නිලධාරී | 01 |
| කාර්යාල සේවකයින් | 02 |

### තැපැල් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව මාසිකව - 2016

| මාසය | ගමන් බලපත්‍ර සංඛ්‍යාව |
|---|---:|
| ජනවාරි | 9,750 |
| පෙබරවාරි | 9,023 |
| මාර්තු | 9,053 |
| අප්‍රේල් | 4,473 |
| මැයි | 10,025 |
| ජුනි | 8,049 |
| ජූලි | 7,642 |
| අගෝස්තු | 12,154 |
| සැප්තැම්බර් | 8,685 |
| ඔක්තෝම්බර් | 9,757 |
| නොවැම්බර් | 8,829 |
| දෙසැම්බර් | 7,427 |
| **එකතුව** | **104,867** |

# තැපැල් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව 2012 – 2016

| වර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| ගමන් බලපත්‍ර සංඛ්‍යාව | 85,957 | 70,961 | 69,768 | 71,817 | 104,867 |



# 03. ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ)/ නියෝජ්‍ය කොමසාරිස් (ඉන්දු ලංකා) යටතේ ප්‍රධාන වශයෙන් ඉන්දු ලංකා පුරවැසි ශාඛාව, ප්‍රතිපත්ති හා සංවර්ධන ශාඛාව හා නීති ශාඛාව ක්‍රියාත්මක වේ.

## 03 : 1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 02 |
| කාර්යාල සේවකයින් | 01 |

### 2016 වසරේ දී ඉටුකළ කාර්යයන්,

01. 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සකස් කිරීම
02. 2016 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව සකස් කිරීම
03. දෙපාර්තමේන්තුව මඟින් අනෙකුත් ආයතනවලට යැවිය යුතු මාසික හා කාර්තු ප්‍රගති වාර්තා සකස් කිරීම.
04. ප්‍රාග්ධන හා අනෙකුත් ව්‍යාපෘති ප්‍රගතිය සම්බන්ධීකරණය, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.
05. අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමග ප්‍රතිපත්ති කටයුතු වලට අදාල රාජකාරි සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.
06. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම හා වෙනත් අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට කටයුතු කිරීම.
07. දෙපාර්තමේන්තුවට අදාල චක්‍රලේඛ නිකුත් කිරීම.

## 2016 වසරේ දී ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ

01. රාජ්‍යතාන්ත්‍රික හා නිල විදේශ ගමන් බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

02. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලය මෙන්ම යෝජිත වයඹ සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය හා වයඹ ලේකම් කාර්යාලය කුරුණෑගල නගරයේ ස්ථාපිත කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

03. ආගාමික හා විගාමික නීති බල ගැන්වීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

04. රාජ්‍යතාන්ත්‍රික සහ නිල /සේවා විදේශ ගමන් බලපත්‍ර හිමියන් වීසා අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජෝර්ජියා රජය අතර අත්සන් කිරීමට නියමිත ගිවිසුම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

05. රාජ්‍යතාන්ත්‍රික සහ නිල /සේවා විදේශ ගමන් බලපත්‍ර හිමියන් වීසා අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා පිලිපීන් ජනරජය අතර අත්සන් කිරීමට නියමිත ගිවිසුම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

06. සංක්‍රමණික කටයුතු පිළිබඳව ස්විස් ෆෙඩරල් කවුන්සිලය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර එළඹෙනු ලබන සහයෝගිතා ගිවිසුම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

07. විද්‍යුත් සංචරණ අනුමැතිය (Electronic Travel Authorization) ලබා දෙන වෙබ් අඩවියෙහි Mobitel ලාංඡනය ප්‍රදර්ශනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

## 2016 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත කාර්යයන්

01. ත්‍රිකුණාමලයේ පිහිටා ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතු ඉඩමේ ආරක්ෂාව සඳහා සහ මායිම් නිරවුල් කර ගැනීම සඳහා ඉඩම වටා මායිම් තාප්පයක් ඉදි කිරීම හා එම ඉඩමෙහි නිලධාරි නිවස්නයක් ඉදිකිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම, ඒ සඳහා ගොඩනැගිලි සැලසුම් සකස් කර ගැනීම හා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කිරීම.

02. ගම්පහ කටාන කළුදියවලවත්ත ඉඩමෙහි ආගමන හා විගමන නීති බලගැන්වීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා අවශ්‍ය අනුමැතින් ලබා ගැනීම, ඒ සඳහා සැලසුම් සකස් කිරීම හා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කිරීම.

03. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මාණ්ඩලික නිලධාරී විවේකාගාරය අළුත්වැඩියා කිරීම.

04. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මාණ්ඩලික නිලධාරී විවේකාගාරය පුළුල් කිරීමේ අරමුණින් නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම.

05. බත්තරමුල්ල පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම

06. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලය මෙන්ම යෝජිත වයඹ සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය හා වයඹ ලේකම් කාර්යාලය කුරුණෑගල නගරයේ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීම

## 03 : 2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

පාලක ජනරාල්වරයා නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ධූරය දරන අතර, පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීම් නියෝජ්‍ය කොමසාරිස් වශයෙන් කටයුතු කරනු ලැබේ.


**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුරු/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 01 |

ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත පුද්ගලයින් ලියාපදිංචි කිරීම හා එම අය හට අවශ්‍ය වන අවස්ථාවලදී තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**<u>තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම 2012 – 2016</u>**

| පනත | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| 1949 අංක 03 | - | - | - | - | **149** |
| 1967 අංක 14 | - | - | - | - | **48** |
| 1988 අංක 39 | 14 | 09 | 19 | 48 | 49 |
| 2003අංක 35 | 08 | 02 | 03 | 02 | 01 |
| 2003 අංක 35 යටතේ දැනුම් දීමේ ලිපි නිකුත් කිරීම | - | - | 01 | - | - |



## 03 : 3 නීති අංශය

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| බලයලත් නිළධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 02 |
| කාර්යාල සේවකයින් | 01 |

**නීති අංශයේ අරමුණු හා කාර්යභාරය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යානුබද්ධ අණපනත් මගින් ලැබී ඇති නෛතික අධිකාරිය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදීමටත්, අවශ්‍යතාවයන් අනුවඅදාළ අණපනත් සංශෝධනය කිරීමට කටයුතු කිරීම මගින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට සහාය වීම.

**නීති අංශයෙන් ඉටුකරන ලද කාර්යයන්:**

1. දෙපාර්තමේන්තුව මගින් පවරා ඇති නඩු වලට අදාළ සිතාසි, වරෙන්තු කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගැනිම සහ එම සිතාසි, වරෙන්තු අවශ්‍ය පුද්ගලයන් වෙත යොමුකිරිමට කටයුතු කිරිම.
2. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුට අධිකරණය ඉදිරියේ සාක්ෂිදිම පිණිස සිතාසි යොමු කර ඇති අවස්ථාවන්හිදී එයට අදාළ තොරතුරු සහ ලිපිගොනු සකස් කර සුදුසු නිලධාරින් අදාළ දිනයන්හිදී අධිකරණ කටයුතු වලට සහභාගීවිම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරිම.
3. අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරිමට නොහැකි,තොරතුරු අසම්පූර්ණ අධිකරණ නියෝග සම්බන්ධ දැනුවත් කිරීමේ ලිපි 726 ක් සකස් කර අදාළ අධිකරණ වෙත යවා ඇත.
4. විශේෂ පොලිස් අපරාධ විමර්ශන ඒකක වලින් සහ විවිධ පොලිස් ස්ථාන වලින් පුද්ගලයන්ගේ වංචා සම්බන්ධයෙන් අදාල පුද්ගලයන්ගේ තොරතුරු විමසා එවා ඇති ලිපිවලට පිලිතුරු ලිපි 33 ක් යවා ඇත.
5. මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි සඳහා දෙපාර්තමේන්තුව වගඋත්තරකරුවන් වශයෙන් නම්කර ඇති අවස්ථාවන් 3 කදී සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මගින් ඉල්ලා ඇති විමර්ශන සඳහා අවශ්‍ය තොරතුරු සහ සාක්ෂි ලබාදීම.ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වගඋත්තරකරුවන් කර ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති මූලික අයිතිවාසිකම් නඩු 4ක් සම්බන්ධව ද නිරීක්ෂණ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.නාරා ආයතනයේ නිලධාරිනියක් සම්බන්ධයෙන් එම ආයතනයේ පැවැත්වූ විනය පරික්ෂණයක් සඳහා ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණ අවස්ථා දෙකකදී පැමිණිල්ලේ සාක්ෂිකරුවකු වශයෙන් ද සාක්ෂි ලබාදිම.
6. දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නාවූ ගොඩනැගිලි, නිවාස සම්බන්ධව අදාළ පාර්ශ්ව අතර ඇති කරගන්නාබදු ගිවිසුම් සකස් කර අත්සන සඳහා යොමු කිරීම සහ අදාල ගිවිසුම්

ලියාපදංචි කිරීමට කටයුතු කිරීම. (මහනුවර, ත්‍රිකුණාමලය, මාතර, රුහුණු මාගම් පුර මහින්ද රාජපක්ෂ වරාය සහ මත්තල ප්‍රාදේශීය කාර්යාලයන්)

- ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය කොළඹ 10, ආනන්ද රාජකරුණා මාවතේ පිහිටි ගොඩනැගිල්ල හිමිකරු වෙත භාරදීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන සැකසීම සහ අදාල කටයුතු කිරීම.

7. දෙපාර්තමේන්තුවේ කටයුතු වලට අදාළ වන්නාවූ කාර්යයන් සම්බන්ධ දේශීය ආයතන සමඟ දෙපාර්තමේන්තුව එළඹ ඇති ගිවිසුම් 23 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

8. ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානයේ සහයෝගයෙන් ආගාමික හා විගාමික පනත සංශෝධනය සඳහා වර්තමාන පනත හා පවතින තත්ත්වය අතර හිදැස හඳුනාගැනීම සඳහා කමිටු (Gap Analysis Committee)පිහිටුවීම හා සංශෝධන යෝජනාවලිය සකස්කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

9. විදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවති නීති විරෝධීව විදේශවල රැඳී සිටින ශ්‍රී ලාංකිකයන් නැවත භාරගැනීම පිළිබඳ යුරෝපා සංගමය සමඟ පැවැති 3 වන සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කිරීම.

10. ස්විස්ටර්ලන්තය සමඟ කොළඹදී පවත්වන ලද සංක්‍රමණිකයන් පිළිබඳ ගිවිසුමේ කෙටුම්පත සකස්කිරීමට දායකවීම.

11. රාජතාන්ත්‍රික හා රාජකාරි ගමන් බලපත්‍ර දරන්නන් සඳහා ද්විපාර්ශික විසා නිදහස් කිරීමේ ගිවිසුම් සකස්කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සිදුකිරීමට කටයුතු කිරීම.
- අත්සන් කළ ගිවිසුම් : ජෝර්ජියා, කසකස්ථානය, පිලිපීනය
- සම්බන්ධීකරණ කරන ලද ගිවිසුම් අත්සන් කිරීමට නියමිත රටවල් : බංගලාදේශය, ජෝර්ජියා

12. කොළඹ පැවැති ඕස්ට්‍රේලියානු සහයෝගිතා සමුළුව නියෝජනය කිරීම.

**පහත සඳහන් පරිදි 2016.01.01 – 2016.12.31 දක්වා කාලය තුල නිලධාරීන් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සාක්ෂි ලබාදීම සඳහා සහභාගී වී ඇත.**

| | **2016.01.01 – 2016.12.31** | | | | | |
|---|---|---|---|---|---|---|
| | ශ්‍රේෂ්ඨාධිකරණය | අභියාචනාධිකරණය | වාණිජ මහාධිකරණය | මහාධිකරණය | දිසා අධිකරණය | මහේස්ත්‍රාත් අධිකරණය |
| කොළඹ | 03 | 02 | 03 | 12 | 02 | 19 |
| මීගමුව | | | | 02 | - | 27 |
| අනෙකුත් | | | | 02 | 02 | 24 |
| එකතුව | 03 | 02 | 03 | 16 | 04 | 70 |

# 04. වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය

## 04.1 වීසා අංශය

පාලක (වීසා හා ප්‍රත්‍යන්ත පාලන) ගේ අධීක්ෂණය යටතේ වීසා ශාඛාව,තොටුපල ශාඛාව හා විමර්ශන ශාඛාව ක්‍රියාත්මක වේ.

**1948** අංක **20** දරණ ආගාමික හා විගාමික පනතේ III කොටස මඟින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කරයි. ඒ යටතේ ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සඳහා ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි **1952** ආගමන හා විගමන රෙගුලාසි අංක **02** සිට අංක **35** ප්‍රකාරව වීසා බලපත් නිකුත් කිරීම හා වීසා දීර්ඝ කිරීම සිදු කරයි. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින්ට මෙරට තුළ නීත්‍යානුකූලව රැඳී සිටීම සඳහා වලංගු වීසා නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ. වීසා නිකුත් කිරීමේ දී ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත වන බවට සහතික කරමින් ජාතික සංවර්ධනයට දායක වීම වීසා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වේ.

උක්ත අරමුණු හා කාර්යයන් මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීමට 2016 වර්ෂය සඳහා වීසා අංශයට අනුයුක්තව සිටි කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| තනතුර/සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලකවරු | 02 |
| සහකාර පාලක | 02 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් | 01 |
| බලයලත් නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 |
| සංවර්ධන නිලධාරී | 04 |
| ගමන් බලපත් සහයක | 01 |
| කාර්යාල කාර්ය සහායක | 09 |

මීට අමතරව ගිණුම් අංශයෙන් සතිපතා අනුයුක්ත කරනු ලබන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් දෙදෙනෙකු සරප් අංශයේ සේවයෙහි යෙදිණි.

### 2016 ප්‍රගතිය

2016.01.01 සිට 2016.12.31 වර්ෂය තුළ පූර්ව අනුමැතීන් ලබාදීම්, නව වීසා නිකුත්කිරීම් සහ දීර්ඝ කිරීම් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| **අනු අංකය** | **විස්තරය** | **ප්‍රමාණය** |
|---|---|---|
| 01 | ඊ - සංචරණ අනුමැතිය ලබා දීම් | 2,191,516 |
| 02 | නව වීසා නිකුත් කිරීම් (වාස වීසා) | 22,673 |
| 03 | වීසා දීර්ඝ කිරීම් - 1) වාස වීසා | 22,483 |
| | 2) සංචාරක වීසා | 60,109 |
| 04 | සාර්ක් වීසා | 1,209 |
| 05 | ද්විත්ව පුරවැසි (ශ්‍රී ලාංකික) | 2,538 |
| | **එකතුව** | **2,300,498** |

★ වාස වීසා දීර්ඝ කිරීම් හා නිකුත් කිරීම් - 2016

| | දීර්ඝ කිරීම් | නිකුත් කිරීම් | තානාපති කාර්යාල වෙත යවනු ලැබූ ෆැක්ස් පණිවුඩ | ගුවන් තොටුපල වෙත යවනු ලැබූ පණිවුඩ (Landing Endorsement) |
|---|---|---|---|---|
| ආයෝජන මණ්ඩල වල සේවයේ නියුතු | 4319 | 2944 | 3666 | 157 |
| ශ්‍රී ලාංකික දෙමාපියන්ගේ දරුවන් | 179 | 329 | - | - |
| පුරවැසි පනතේ 5.2 වගන්තිය යටතේ | - | 1615 | - | - |
| පුරවැසි පනතේ 5.1 වගන්තිය යටතේ | - | 467 | - | - |
| පූජ්‍ය පක්ෂය | 800 | 247 | 157 | 32 |
| උසාවි නියෝග | 123 | 11 | - | - |
| රාජ්‍යතාන්ත්‍රික | - | 822 | 74 | 08 |
| කලින් ශ්‍රී ලාංකිකයින්ව සිටි | 2047 | 1480 | - | - |
| වෛද්‍ය හේතුන් මත පැමිණි | 416 | 389 | - | - |
| රාජ්‍යය නොවන සංවිධාන | 111 | 116 | 274 | 23 |
| රාජ්‍ය අංශයේ සේවයට පැමිණි | 2849 | 4420 | 3580 | 392 |
| ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන | 92 | 103 | 17 | - |
| පුද්ගලික අංශයේ සේවයේ නියුතු | 3141 | 6314 | 2353 | 180 |
| ලියාපදිංචි ඉන්දියානුවන් | - | 30 | - | - |
| ආගමික කාර්යයන් සඳහා පැමිණි | 437 | 1039 | 1356 | 191 |
| දීර්ඝ කාලීන නේවාසික වීසා (වසර 05) (RGS) | 16 | 03 | - | - |
| ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ කලත්‍රයන් | 3350 | 1165 | 01 | - |
| SSRV (My Dream Home) | 172 | 56 | - | - |
| රාජකාරි | 355 | 293 | 868 | 65 |
| ශිෂ්‍ය / ශිෂ්‍යත්වලාභින් | 4076 | 3734 | 2233 | 119 |
| **එකතුව** | **22483** | **22673** | **14665** | **1168** |

**වීසා අංශය මගින් සිදු කරන ලද විශේෂ කාර්යයන්**

1. වීසා නිකුත් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයන්හි දී අනාවරණය වූ කරුණු වලට අදාලව හෝ ආගමන හා විගමන පාලක ජනරාල් වෙත ලැබුණු පැමිණිලි විභාගයෙන් අනතුරුව හෝ වීසා ලබා දීමට පාදක වූ ආයතන හා සම්බන්ධිත පුද්ගලයන්ගේ ඉල්ලීම් මත හෝ ලබා දී තිබූ වීසා අවලංගු කිරීම සහ අසාධු ලේඛන ගත කිරීම.

2. 2014 වර්ෂය තුළ ඇතිවූ ජාතික ආරක්ෂාව පිළිබඳ විශේෂ තත්ත්ව යටතේ පාකිස්තානු, ඇෆ්ගනිස්ථාන්, ඊජිප්තු හා සිරියානු ජාතිකයින් මෙරටට පැමිණීමේදී රාජ්‍ය බුද්ධි අංශයට යොමු කර ආරක්ෂක නිෂ්කාශණ ලබා ගැනීම නොකඩවා සිදු කිරීම.

3. ශිෂ්‍ය වීසා ලබා ගනිමින් රටතුල සිටින මාලදිවයින් ශිෂ්‍යයින්, ඔවුන්ගේ යැපෙන්නන් හා භාරකරුවන් පසුගිය වර්ෂ කිහිපය තුළ සංචාරක වීසා ලබාගනිමින් මෙරටට පැමිණි පසු තම වීසා, ශිෂ්‍ය වීසා බවට පත්කරගැනීමට තිබූ ගැටළු මගහරවා ගැනීමට අදාල අධ්‍යාපන ආයතන මඟින් අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා සකස් කරන ලද විශේෂ දත්ත පෝරමය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාස වීසා නිකුත් කරන අතර, විදේශීය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට, භික්ෂුනීන් වහන්සේලාට හා වෛද්‍ය සිසුන්ට ගාස්තු අයකර වීසා ලබා දීම නොකඩවා සිදු කිරීම .

4. වීසා ක්‍රමවේදය සමාලෝචනය කර වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමට පත් කරන ලද කමිටු වාර්තාව ගත් තීරණය අනුව ඉදිරි පියවර ක්‍රියාත්මක කිරීම.

5. වීසා ලබා දෙන ලද අයදුම්පත් පරිලෝකණය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි. පළමු පියවර වශයෙන් 2014 වර්ෂයේ සිට 2016 පෙබරවාරි 07 වන දින දක්වා ලිපි ගොණුද, දෙවන පියවර වශයෙන් 2016 පෙබරවාරි 08 වන දින සිට 2016 ඔක්තෝබර් 01 වන දින දක්වා ලිපි ගොණු ද පරිලෝකණය කරන ලදි. මෙම කටයුතු සංජේ ලංකා පෞද්ගලික ආයතනය මඟින් ඉටු කරන ලදි.

6. රබර් මුද්‍රා මගින් යෙදු පිටසන වෙනුවට ස්ටිකර් මඟින් වීසා ලබා දීම 2016.06.15 වන දින සිට ආරම්භ කිරීම මෙම වසර තුල ලැබූ සාධනීය පියවරකි. මෙමගින් ව්‍යාජ වීසා නිකුත් කිරීමේ මං ඇහිරේ.

7. ආගමන විගමන දෙපාර්තමේන්තුව 2016.08.26 වන දින බත්තරමුල්ල , සුහුරුපාය , නව ගොඩනැගිල්ලේ 4 වන මහලේ පර්යන්ත 03 ක (A . B, C ) වඩා ඉඩ පහසුකම් සහිතව ස්ථාපිත විය . එමගින් වීසා අංශයේ ඉඩකඩ ප්‍රශ්නයට විසඳුම ලැබිණි.

8. නව ගොඩනැගිල්ලට සම්ප්‍රාප්තියත් සමග 2016.08.26 වන දින වීසා අංශය රාජකාරීවලින් බැහැර වූ අතර , 2016.08.29 දින සිට රාජකාරී ආරම්භ කරන ලදි. එදින සිට පෙර පරිදි වීසා ලබා දීම සිදු කරන කරන ලදි.

9. 2016 ඔක්තෝබර් 03 වන දින සිට විෂයය භාර නිලධාරීන් විසින් තම විෂයට අදාළ අයදුම් පත්‍ර පරිලෝකණය කිරීම ආරම්භ කරන ලදි. එයට පසු සතියේ සිට එනම් 2016.10.10 දින සිට පරිලෝකණය කරන ලද අයදුම් පත්‍ර අයදුම්කරුවන් වෙත ලබා දීම සිදු කිරීම තුලින් පරිශ්‍රය තුල අනවශ්‍ය ලේඛන එකතු වීම අවම කිරීම මෙම වසර තුල ලැබූ විශේෂ ජයග්‍රහනයකි.

10. වීසා ලබා දීමේ ක්‍රියාවලිය ප්‍රති නිර්මානයගත කරමින් වීසා ලබා දීම සඳහා නව පද්ධතියක් ප්‍රධාන ශාඛාවේ ස්ථාපනය කිරීම හා ඒ සඳහා අවශ්‍ය උපාංග සවි කිරීම.

11. තෝරා ගත් රටවල් කිහිපයක් සඳහා සංචාරක වීසා දීර්ඝ කිරීම අන්තර්ජාලය හරහා සිදු කිරීමට අදාල මූලික කටයුතු සාකච්ඡා කිරීම.

12. Credit Card මඟින් වීසා ගාස්තු අය කිරීම 2016.12.09 වන දින සිට ආරම්භ කිරීම මගින් ගණුදෙනුකරුවන් සඳහා පහසුවක් සේ ම ගනුදෙනු විනිවිද භාවයකින් පවත්වා ගත හැකි වීම .

13. අංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම සෑම මාසයකම අවස්ථා දෙකකදී පැවැත්වීම මඟින් පවතින අඩුපාඩු හා ගැටළු සාකච්ඡා කර විසඳා ගැනීම.

**2017 වර්ෂය සඳහා අපේක්ෂිත ව්‍යාපෘතීන්**

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පැමිණීමේ වීසා ක්‍රම වේදය ස්වයංකරණය කිරීම අරමුණු කර ගෙන මගීන්ට පහසුවෙන් වීසා ලබා ගත හැකි වන පරිදි Kiosks යන්ත්‍ර සවි කිරීම.

2. වර්තමානයේ පවතින වීසා ලබා දීමේ පද්ධතිය තව දුරටත් පරිශීලක මිත්‍ර ආකාරයෙන් සහ නව පහසුකම් හඳුන්වා දෙමින් ප්‍රතිනිර්මානගත කිරීම.

3. සංචාරක වීසා දිගු කිරිමේ ක්‍රියාවලිය මාර්ගගතව සිදුකල හැකි ආකාරයට නව පද්ධතියක් හඳුන්වා දීම.

4. වීසා අයදුම්පත් ඉදිරිපත් කල අවස්ථාවේ සිට වීසා පිටසන ලබා දෙන තෙක් සමස්ථ ක්‍රියාවලියේ තොරතුරු කෙටි පණිවිඩ ආකාරයට අදාළ අයදුම්කරුවන්ට යොමු කිරීමට පද්ධතියක් නිර්මාණය කිරීම.

5. වීසා ස්ටිකර් නිකුත් කිරීම සඳහා ඉන්වෙන්ට්‍රි පද්ධතියක් හඳුන්වා දීම.

6. නව පෝලිම් කළමණාකරන ක්‍රමවේදය තුලින් වඩාත් කාර්යක්ෂමව හා විනිවිද භාවයෙන් යුතුව පාරිභෝගිකයන්ට පහසුකම් සැලසීම.

7. 2017 අයවැය යෝජනා ප්‍රකාරව වීසා ගාස්තු සංශෝධනය මගින් රාජ්‍ය ආදායම ඉහල නැංවීම හා විෂමතා දුරු කිරීම

## 04 : 2 තොටුපළ ශාඛාව.

## තොටුපල හා විමර්ශන අංශය

පාලක (වීසා) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය-2016**

| තනතුර/සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලකවරු | 02 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරින් | 33 |
| බලයලත් නිලධාරීන් | 312 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 07 |
| කාර්යාල සේවකයින් | 03 |


**අනුමත ඇතුල්වීමේ හා පිටත්වීමේ තොටුපල**


1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල - කටුනායක
2. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල
3. කොළඹ ගුවන් තොටුපල - රත්මලාන
4. පලාලි ගුවන් තොටුපල
5. කොග්ගල ගුවන් තොටුපල
6. කොළඹ වරාය
7. ගාල්ල වරාය
8. මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය
9. ත්‍රිකුණාමල වරාය
10. කන්කසන්තුරේ වරාය
11. තලේමන්නාරම් ජැටිය
12. නොරොච්චෝලේ වරාය
13. ඔලුවිල් වරාය

## එක් එක් තොටුපලවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2016

| අනු අංකය | තොටුපල | පැමිණි සංඛ්‍යාව | පිටත් වූ සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| 1 | කටුනායක ගුවන් තොටුපල | 3,622,708 | 3,580,898 | **7,203,606** |
| 2 | හම්බන්තොට වරාය | 78 | 61 | **139** |
| 3 | මත්තල ගුවන් තොටුපල | 2,262 | 2,697 | **4,959** |
| 4 | කොළඹ වරාය | 10792 | 10055 | **20,847** |
| 5 | ගාල්ල වරාය | 15,531 | 13,807 | **29,338** |
| 6 | නොරොච්චෝලේ වරාය | 166 | 130 | **296** |
| 7 | ත්‍රිකුණාමලය වරාය | 519 | 622 | **1,141** |
| 8 | රත්මලාන ගුවන් තොටුපල | 20 | 35 | **55** |
| | එකතුව | **3,652,076** | **3,608,305** | **7,260,381** |


## එක් එක් තොටුපලවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2016




## ශ්‍රී ලංකාවට පැමිණි හා පිටවූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව -2016

| | පැමිණි සංඛ්‍යාව | | | පිටවූ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| මාසය | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශීය | පැමිණි මුළු සංඛ්‍යාව | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශීය | පිටත්වූ මුළු සංඛ්‍යාව |
| ජනවාරි | 120,521 | 204,011 | 324,532 | 119,837 | 226,586 | 346,423 |
| පෙබරවාරි | 97,538 | 205,216 | 302,754 | 111,153 | 213,511 | 324,664 |
| මාර්තු | 118,312 | 201,211 | 319,523 | 109,722 | 200,585 | 310,307 |
| අප්‍රේල් | 142,724 | 146,322 | 289,046 | 132,485 | 170,339 | 302,824 |
| මැයි | 116,039 | 134,024 | 250,063 | 112,645 | 141,054 | 253,699 |
| ජුනි | 119,997 | 126,773 | 246,770 | 99,501 | 115,424 | 214,925 |
| ජූලි | 133,863 | 220,266 | 354,129 | 111,121 | 173,875 | 284,996 |
| අගෝස්තු | 137,734 | 197,583 | 335,317 | 152,826 | 231,865 | 384,691 |
| සැප්තැම්බර් | 120,782 | 157,939 | 278,721 | 138,335 | 170,948 | 309,283 |
| ඔක්තෝබර් | 111,106 | 159,571 | 270,677 | 118,044 | 158,984 | 277,028 |
| නොවැම්බර් | 115,969 | 177,793 | 293,762 | 108,056 | 163,715 | 271,771 |
| දෙසැම්බර් | 150,419 | 236,363 | 386,782 | 134,061 | 193,633 | 327,694 |
| **එකතුව** | **1,485,004** | **2,167,072** | 3,652,076 | **1,447,786** | **2,160,519** | 3,608,305 |



## ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව කලාප අනුව - 2016

| මාසය | අප්‍රිකාව | ආසියාව | ඔස්ට්‍රේලියාව | යුරෝපය | උතුරු ඇමරිකාව | දකුණු ඇමරිකාව | ඇන්ටාර්ටිකා | හඳුනා නොගත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 1,473 | 94,639 | 8,560 | 88,675 | 10,133 | 418 | 1 | 112 | **204,011** |
| පෙබරවාරි | 1,359 | 91,678 | 5,458 | 97,056 | 9,126 | 436 | 0 | 103 | **205,216** |
| මාර්තු | 1,997 | 92,329 | 7,527 | 88,675 | 10,090 | 435 | 0 | 158 | **201,211** |
| අප්‍රේල් | 1,475 | 77,642 | 6,086 | 53,354 | 7,343 | 295 | 0 | 127 | **146,322** |
| මැයි | 1,548 | 85,287 | 4,664 | 34,178 | 7,823 | 299 | 0 | 225 | **134,024** |
| ජූනි | 1,070 | 72,234 | 7,270 | 36,755 | 9,099 | 249 | 0 | 96 | **126,773** |
| ජූලි | 1,954 | 107,962 | 8,965 | 89,573 | 11,409 | 276 | 0 | 127 | **220,266** |
| අගෝස්තු | 1,698 | 101,084 | 7,833 | 76,374 | 10,197 | 230 | 0 | 167 | **197,583** |
| සැප්තැම්බර් | 2,112 | 90,464 | 7,626 | 50,620 | 6,628 | 340 | 0 | 149 | **157,939** |
| ඔක්තෝබර් | 1,320 | 86,939 | 5,441 | 58,643 | 6,708 | 354 | 0 | 166 | **159,571** |
| නොවැම්බර් | 1,723 | 90,531 | 7,397 | 69,974 | 7,612 | 361 | 0 | 195 | **177,793** |
| දෙසැම්බර් | 3,365 | 106,658 | 17,995 | 93,483 | 14,275 | 502 | 0 | 85 | **236,363** |
| **එකතුව** | **21,094** | **1,097,447** | **94,822** | **837,360** | **110,443** | **4,195** | **1** | **1,710** | **2,167,072** |



# ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව තොටුපල අනුව - 2016

| තොටුපල | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 120352 | 97358 | 118094 | 142060 | 115720 | 119704 | 133594 | 137534 | 120625 | 11369 | 115745 | 150185 | 1481340 |
| නොරොච්චෝල වරාය | 0 | 0 | 0 | 1 | 2 | 0 | 0 | 0 | 1 | 4 | 12 | 9 | 29 |
| මත්තල ගුවන් තොටුපල | 41 | 39 | 52 | 63 | 124 | 97 | 110 | 79 | 58 | 70 | 58 | 54 | 845 |
| කොළඹ වරාය | 64 | 70 | 77 | 497 | 67 | 71 | 58 | 60 | 31 | 573 | 54 | 48 | 1670 |
| ගාල්ල වරාය | 52 | 65 | 72 | 97 | 123 | 120 | 81 | 54 | 59 | 83 | 89 | 114 | 1009 |
| ත්‍රිකුණාමලය වරාය | 12 | 6 | 17 | 06 | 03 | 5 | 20 | 7 | 8 | 7 | 11 | 09 | 111 |
| **එකතුව** | 120521 | 97538 | 118312 | 142724 | 116039 | 119997 | 133163 | 137734 | 120782 | 111106 | 115969 | 150419 | 1485004 |

# ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයින් සංඛ්‍යාව තොටුපල අනුව - 2016


| තොටුපල | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 201,603 | 203,115 | 199,048 | 144,201 | 132,322 | 125,112 | 218,507 | 195,712 | 156,128 | 156,122 | 175,254 | 234,244 | 2,141,368 |
| හම්බන්තොට වරාය | 4 | 16 | 8 | 3 | 11 | 2 | 7 | 1 | 3 | 6 | 15 | 2 | 78 |
| මත්තල ගුවන් තොටුපල | 13 | 30 | 50 | 72 | 61 | 75 | 232 | 181 | 229 | 62 | 261 | 151 | 1,417 |
| නොරොච්චෝලේ වරාය | 2 | 17 | 7 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 55 | 32 | 22 | 137 |
| කොළඹ වරාය | 881 | 846 | 692 | 773 | 444 | 472 | 440 | 521 | 369 | 2033 | 973 | 678 | 9,122 |
| ගාල්ල වරාය | 1,489 | 1,155 | 1,379 | 1,261 | 1,175 | 1,068 | 1,027 | 1,132 | 1,143 | 1,252 | 1,210 | 1,231 | 14,522 |
| රත්මලාන ගුවන් තොටුපල | 6 | 3 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 0 | 8 | 0 | 0 | 20 |
| ත්‍රිකුණාමලය වරාය | 13 | 34 | 27 | 11 | 11 | 43 | 50 | 36 | 67 | 33 | 48 | 35 | 408 |
| එකතුව | 204,011 | 205,216 | 201,211 | 146,322 | 134,024 | 126,773 | 220,266 | 197,583 | 157,939 | 159,571 | 177,793 | 236,363 | 2,167,072 |

# රට තුළට ඇතුල්වීමට අවසර නොදුන් විදේශිකයන් (Refused entry) – 2016

| ජාතිය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බංග්ලාදේශ් | | | 1 | 1 | | 2 | | 5 | | 1 | 13 | 12 | 35 |
| ඉන්දියන් | 25 | 17 | 13 | 26 | 12 | 25 | 21 | 9 | 23 | 22 | 16 | 8 | 217 |
| ස්වීඩන් | 1 | | | | | | | 1 | | 1 | | | 3 |
| පලස්තීන් | | | | | 3 | | 1 | | | | | | 4 |
| කැමරූන් | | | | | | | | | | | 1 | 13 | 14 |
| පකිස්තාන් | 23 | 20 | 21 | 23 | 30 | 2 | 11 | 34 | 11 | 10 | 42 | 12 | 239 |
| චීන | | 35 | 34 | 15 | 12 | 14 | 6 | 17 | 28 | 39 | 10 | | 210 |
| ඇෆ්ගනිස්තාන් | 22 | 32 | 42 | 6 | 1 | 4 | 1 | 17 | 3 | 1 | 2 | 35 | 166 |
| රුසියන් | 1 | | 2 | | | 1 | | 1 | | 2 | | | 7 |
| ඉන්දුනීසියන් | | | 1 | | | | | | | 2 | | | 3 |
| ප්‍රංශ | | | 2 | | | | | | | | | | 2 |
| සවුදිඅරාබි | | | | | | | 1 | | | | | | 1 |
| කිර්ගිස්තාන් | | 1 | | | | | | | | | | | 1 |
| ඕස්ට්‍රේලියන් | 1 | 2 | | | | | | | | | | | 3 |
| නයිජීරියන් | | | | 2 | | | | 2 | | 3 | | 1 | 8 |
| ඇමෙරිකන් | | | | | | | | | 1 | | | | 1 |
| ඉරාන් | | 3 | | | | 2 | 4 | | | 1 | | 2 | 12 |
| ජර්මන් | 1 | | | | | | 1 | 1 | | | | 1 | 4 |
| යුක්රේන් | | | | | 3 | | | | | | | | 3 |
| ඉතාලි | | | | | 1 | | | | | | | | 1 |
| බ්‍රිතාන්‍ය | 1 | | | 1 | | | | 2 | | | | | 4 |
| අයිවරි කෝස්ට් | 1 | | | 1 | | | 1 | | | | | | 3 |
| නවසීලන්ත | | | | | | | | | | | | 4 | 4 |
| මාලදිවයින් | 1 | | | | 1 | | | 1 | 2 | | | | 5 |
| ජපන් | 1 | | | | | | | | | | 1 | | 2 |
| ගිනි | 1 | | | | | | | | | | | | 1 |
| කැනේඩියන් | | | | 1 | 1 | | | | | | 1 | 1 | 4 |
| සියරා ලියෝන් | | | | | | 1 | | | | | | | 1 |
| උස්බෙකිස්ථාන් | | | | | | | | | | | 1 | | 1 |
| තුර්කි | | | | 1 | | | | | | | | | 1 |
| සිංගපූර් | | | | | | | | | | 1 | | | 1 |
| භූතාන් | | | | | | | | | | 1 | | | 1 |


| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිරියන් | | | | | | | 1 | | 5 | | | | 6 |
| බොලිවියානු | | | | | | | | | | 1 | | | 1 |
| කුවේට් | | | | | | | | | | 1 | | | 1 |
| නේපාල් | 8 | | 21 | | | | | 1 | | 35 | 13 | | 78 |
| තායිලන්ත | | | 1 | | 1 | 2 | | 3 | | | | | 7 |
| නෙදර්ලන්ත | | | | 1 | | | | | | | | | 1 |
| යේමන් | | | | | 8 | | | | | | | | 8 |
| පිලිපීන | | | | 1 | | | | | | | | | 1 |
| උගන්ඩා | | | | | 3 | | | | | | | | 3 |
| ඝානා | | | | | 1 | 2 | | | | 1 | | | 4 |
| ආර්ජන්ටිනා | | | | 1 | | | | | | | | | 1 |
| ස්පාඤ්ඤ | | | | | | | | | | | | 3 | 3 |
| කොරියා | | | | 1 | 1 | | | | | | | | 2 |
| ඊජිප්තු | 2 | | 11 | 5 | 6 | 1 | 4 | 3 | 3 | | | 6 | 41 |
| මැලේෂියන් | | | 2 | | | | | 1 | | | | | 3 |
| මුරුසි | | | 1 | | | | | | | | | | 1 |
| ඊශ්‍රායල් | | | 2 | | | 2 | 1 | | 1 | | | | 6 |
| ටැන්සානියා | | 3 | | | | | | 3 | | | | | 3 |
| **එකතුව** | **89** | **113** | **154** | **85** | **84** | **58** | **55** | **98** | **78** | **123** | **99** | **98** | **1134** |

## <u>රට තුළට ඇතුල්වීමට අවසර නොදුන් විදේශිකයන් (Refused entry) – 2016</u>




## නෞකා කාර්ය මණ්ඩලය - පැමිණීම 2016

| මාසය | කොළඹ වරාය | ගාල්ල වරාය | ත්‍රිකුණාමලය වරාය | නොරොච්චෝලේ වරාය | හම්බන්තොට වරාය | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 505 | 1477 | 28 | 07 | 01 | 2018 |
| පෙබරවාරි | 421 | 1087 | 13 | 17 | 12 | 1550 |
| මාර්තු | 497 | 1315 | 38 | 07 | 02 | 1859 |
| අප්‍රියෙල් | 491 | 1190 | 17 | 08 | 03 | 1709 |
| මැයි | 483 | 1234 | 28 | 01 | 11 | 1757 |
| ජුනි | 474 | 1155 | 10 | - | 03 | 1642 |
| ජූලි | 428 | 1099 | 37 | - | 04 | 1568 |
| අගෝස්තු | 526 | 1102 | 28 | - | - | 1656 |
| සැප්තැම්බර් | 374 | 1137 | 74 | - | 05 | 1590 |
| ඔක්තෝම්බර් | 468 | 1121 | 35 | 10 | 06 | 1640 |
| නොවැම්බර් | 498 | 968 | 92 | 44 | 12 | 1614 |
| දෙසැම්බර් | 571 | 1226 | 32 | 31 | 02 | 1862 |
| එකතුව | **5736** | **14111** | **432** | **94** | **61** | **20465** |



## **නෞකා කාර්ය මණ්ඩලය පිටවීම - 2016**

| මාසය | කොළඹ වරාය | ගාල්ල වරාය | ත්‍රිකුණාමලය වරාය | නොරොච්චෝලේ වරාය | හම්බන්තොට වරාය | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 471 | 1303 | 20 | 08 | 01 | 1803 |
| පෙබරවාරි | 447 | 1056 | 20 | 17 | 09 | 1549 |
| මාර්තු | 512 | 1262 | 38 | 09 | 03 | 1824 |
| අප්‍රියෙල් | 395 | 1163 | 22 | 06 | 04 | 1590 |
| මැයි | 517 | 1216 | 26 | 01 | 09 | 1769 |
| ජුනි | 470 | 1097 | 68 | - | 06 | 1641 |
| ජූලි | 455 | 1090 | 33 | - | 03 | 1581 |
| අගෝස්තු | 510 | 881 | 35 | - | - | 1426 |
| සැප්තැම්බර් | 420 | 936 | 33 | 02 | 04 | 1395 |
| ඔක්තෝම්බර් | 399 | 1000 | 34 | 09 | 07 | 1449 |
| නොවැම්බර් | 513 | 951 | 69 | 59 | 16 | 1608 |
| දෙසැම්බර් | 514 | 1053 | 41 | 25 | - | 1633 |
| එකතුව | **5623** | **13008** | **439** | **136** | **62** | **19268** |



## නාවිකයන් සඳහා බැඳුම්කර (ස්ටිකර් ) නිකුත් කිරීම - මාසිකව ආදායම 2016

| මාසය | නිකුත් කළ ස්ටිකර් ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු. 1000/-) |
|---|---|---|
| ජනවාරි | 3066 | 3066000 |
| පෙබරවාරි | 2560 | 2560000 |
| මාර්තු | 3655 | 3655000 |
| අප්‍රියෙල් | 3549 | 3549000 |
| මැයි | 2577 | 2577000 |
| ජුනි | 3121 | 3121000 |
| ජූලි | 2714 | 2714000 |
| අගෝස්තු | 3020 | 3020000 |
| සැප්තැම්බර් | 2575 | 2575000 |
| ඔක්තෝම්බර් | 2947 | 2947000 |
| නොවැම්බර් | 3266 | 3266000 |
| දෙසැම්බර් | 2523 | 2523000 |
| එකතුව | **35573** | **35573000** |

## ගමන් බලපත්‍ර කුරියර් කිරීමට අනුමතිය දීම -2016

ශ්‍රී ලංකාව තුල තනාපති කාර්යාල පිහිටා නොමැති රටවලට ඇතුළුවීමට අවශ්‍ය වන වීසා ලබා ගැනීම සඳහා එම රටවල්වල තානාපති කාර්යාල පිහිටා ඇති රටකට ගමන් බලපත්‍ර යැවීම සඳහා අනුමතිය ලබා දේ. (උදාහරණයක් ලෙස නවසීලන්ත වීසා ලබා ගැනීම සඳහා ඉන්දියාවේ නවදිල්ලි නුවරට ගමන් බලපත්‍ර කුරියර් කරනු ලැබේ.)

ගමන් බලපත්‍ර 30676 ක් දෙපාර්තමේන්තු අනුමතිය යටතේ කුරියර් කිරීමට අවසර ලබා දී ඇති අතර, එක් ගමන් බලපතක් සඳහා රු.1000/- ක මුදලක් අය කරනු ලැබේ. එමගින් රු.30676000.00 ක ආදායමක් උපයා ඇත.

## ගමන් බලපත්‍ර කුරියර් කිරීමේ ප්‍රගතිය 2012 – 2016

| වර්ෂය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| ආදායම රුපියල් | 26,286,000.00 | 28,820,000.00 | 30,676,000.00 |

## 04 : 3 විමර්ශන ශාඛාව

පාලක (වීසා) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 01 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් | 01 |
| බලයලත් නිලධාරීන් | 07 |

## මිරිහාන කඳවුරට ඇතුළත් කරන ලද විදේශිකයන් රටින් ඉවත් කිරීම - 2016

| ජාතිය | සංඛ්‍යාව |
|---|---|
| බංග්ලාදේශ | 46 |
| චීන | 04 |
| ඉන්දියානු | 75 |
| ඉරාන | 04 |
| ඉරාක | 02 |
| ඕස්ට්‍රේලියා | 02 |
| ජර්මන් | 02 |
| ලෙබනන් | 03 |
| බ්‍රිතාන්‍ය | 01 |
| නයිජීරියානු | 03 |
| පාකිස්තානු | 09 |
| කැනේඩියානු | 01 |
| රුසියානු | 01 |
| යුක්රේන | 2 |
| තායිලන්ත | 01 |
| මැලේසියානු | 01 |
| ස්වීඩන් | 01 |
| යේමන් | 01 |
| **එකතුව** | **159** |

**මානව වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය (NCHTRC) යටතේ පැවති පුහුණු වැඩසටහන් සඳහා දායකවීම්.**

- 2015 – 2019 මානව වෙළඳාම තුරන් කිරීම සඳහා වූ උපාය මාර්ගික සැලැස්මට දායකත්වය සැපයීම
- මානව වෙළඳාම සම්බන්ධව සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (S.O.P.) සඳහා දායක වීම

## <u>ඉටු කරන ලද විශේෂිත කාර්යයන්</u>

සරණාගාතයින් පිළිබඳ ජාත්‍යන්තර නීතිය සම්බන්ධව එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වන මහකොමසාරිස් කාර්යාලයේ (UNHCR) අනුග්‍රහයෙන් බලයලත් නිලධාරීන් 40ක් පමණ වැඩමුලුවකට සහභාගී කරවීම.

## 05. තොරතුරු තාක්ෂණ අංශය

පාලක (තොරතුරු තාක්ෂණ) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක (තොරතුරු තාක්ෂණ) | 01 |
| බලයලත් නිලධාරීන් | 05 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 03 |
| ගමන් බලපත්‍ර සහායක | 03 |
| කාර්යාල සේවකයින් | 01 |

තොරතුරු තාක්ෂණ අංශයේ මූලික වගකීම වන්නේ දැනට පවත්නා මෘදුකාංග හා දෘඩාංග බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහ මහජනතාවට උපරිම සේවා පහසුව හා රජයට ප්‍රශස්ත පිරිවැයක් දැරෙන පරිදි නව ක්‍රමවේද හඳුන්වා දෙමින් තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරිම වේ.

එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමග නිසි පරිදි ගිවිසුම් යාවත්කාලීන කිරිම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරිම ද මෙම අංශයේ තවත් කර්තව්‍යයක් වේ.

ඉහතින් දැක්වූ මූලික කාර්යය භාරයට අමතරව පහත දැක්වෙන විශේෂිත කාර්යයන්ද තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉටු කරනු ලැබිනි.

(1) 1. මහජන අවශ්‍යතා කෙරෙහි සංවේදි වෙමින් පවත්නා පරිගණක මෘදුකාංග මොඩියුලර් පහ සඳහා හඳුනාගත් වැඩිදියුණු කිරිම් සිදුකොට සේවා ඵලදායිතාව ඉහල නැංවීම.

2. දෙපාර්තමේන්තුව සඳහා බත්තරමුල්ලේ ඉදිවෙමින් තිබූ නව ගොඩනැගිලි සංකීර්ණයෙහි පරිගණක පද්ධතිය මැනවින් ස්ථාපිත කිරිමෙහිලා අවශ්‍ය මූලික කටයුතු ඉටුකරදීම. සමස්ථ දත්ත පද්ධතිය සජීවීව පවත්වා ගනිමින් ඉටුකළ යුතු මෙම අභියෝගාත්මක කාර්යය නිවැරදිව නව ගොඩනැගිලි පරිශ්‍රය තුල සාර්ථකව ඉටු කරන ලදි.

3. ජෛවමිතික ගමන් බලපත්‍ර නිකුත් කිරිමේ ව්‍යාපෘතියෙහි දෙවන අදියර වන ඇඟිලි සළකුණු තහවුරු කිරිම 2016 වර්ෂයේ පළමු මාස තුන ඇතුලත නිම කිරිම..

**(2) අස්ථානගත වූ සොරකම් කරන ලද ගමන් බලපත්‍ර ඒකකය (SLTD)**

අස්ථානගත වූ, සොරකම් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳව පොලිස් ස්ථාන විසින් ලබා දෙන තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් සෘජුවම හෝ දෙපාර්තමේන්තුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබේ. ඒවා විමර්ශනය කොට, එම ගමන් බලපත්‍ර නැවත පරිහරණය කළ නොහැකි පරිදි අවලංගු කර, ජාත්‍යන්තර පොලිසිය (INTERPOL) වෙත යවනු ලබයි. එවැනි ගමන් බලපත්‍රයක් මගින් වෙනත් පුද්ගලයෙකු විදේශගත වීම වැලැක්වීමට පියවර ගෙන ඇති අතර, එවැනි නීති විරෝධි කටයුතු සිදුවීම වැලැක්වීම (SLTD) පද්ධතියේ මූලික අරමුණ වේ.

2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා මධ්‍යම තොරතුරු කාර්යාංශය (NCB) හා විදේශිය දූත මණ්ඩල (SLDM) විසින් ගමන් බලපත්‍ර 8303 ක් දෙපාර්තමේන්තුවට එවා ඇති අතර ගමන් බලපත්‍ර 5663ක් ජාත්‍යන්තර පොලිසියේ දත්ත පද්ධතියට යවා ඇත.

**(3) ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS)**

ආගමන හා විගමන තොරතුරු හා සංඛ්‍යා ලේඛන ලබා දීම සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) ස්ථාපනය කරන ලදි. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාලයන් සෘජුව සම්බන්ධතා පවත්වන්නේ මෙම අංශය සමග වන අතර අවශ්‍ය විටකදි වීසා නිකුත් කිරීමට පෙර විදේශ ගමන් බලපත්‍ර පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම මෙම අංශය හරහා කරනු ලබයි. 2016.01.01 සිට 2016.12.31 දින දක්වා අප දෙපාර්තමේන්තුව මගින් විමසුම් 1932 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

| අංකය | ආයතනය | එකතුව |
|---|---|---|
| 01 | ජර්මන් තානාපති කාර්යාලය | 100 |
| 02 | ප්‍රංශ තානාපති කාර්යාලය | 86 |
| 03 | නෝර්වේ තානාපති කාර්යාලය | 16 |
| 04 | ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය | 336 |
| 05 | නෙදර්ලන්ත තානාපති කාර්යාලය | 2 |
| 06 | ඇමරිකානු තානාපති කාර්යාලය | 69 |
| 07 | ඉතාලි තානාපති කාර්යාලය | 9 |
| 08 | ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය | 137 |
| 09 | කැනඩා මහ කොමසාරිස් කාර්යාලය | 17 |
| 10 | එක්සත් රාජධානි මහ කොමසාරිස් කාර්යාලය | 169 |
| 11 | සංගණන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව | 7 |
| 12 | ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, බ්‍රිතාන්‍ය<br>(බ්‍රිතාන්‍යයේ සිටින ශ්‍රී ලාංකිකයන් විසින් ගමන් බලපතක් අයදුම් කිරීමේදී ද අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර නිරවද්‍යතාවය තහවුරු කරගනු ලබයි) | 955 |
| 13 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය | 23 |
| 14 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 4 |
| 15 | තායිලන්ත තානාපති කාර්යාලය | 2 |
| | **එකතුව** | **1932** |

## 06. ගිණුම් අංශය

ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශයේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| තනතුර/සේවාව | තනතුරු ගණන |
|---|---|
| ගණකාධිකාරී (ආදායම්) | 01 |
| ගණකාධිකාරී (ගෙවීම්) | 01 |
| පරිපාලන නිලධාරී (මුදල්) | 01 |
| අයවැය සහකාර | 01 |
| සංවර්ධන නිලධාරී | 03 |
| කළමනාකරණ සහකාර | 20 |
| සරප් නිලධාරී | 36 |
| කාර්යාල සේවකයින් | 06 |

### මූල්‍ය කළමනාකරණය


ආගමන හා විගමන දෙපර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය මුදල් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන මෙහි ආදායම් හා වියදම් පිළිබඳ කළමනාකරණය, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු නියමිත සීමාවන් තුළ පවත්වාගෙන යාම, භාණ්ඩාගාර චක්‍ර ලේඛ ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික/මාසික වාර්තාවන් (වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව, විසර්ණ ගිණුම, මාසික ගිණුම් සාරාංශ) පිළියෙල කර නියමිත දිනයන්හි භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම සහ මුදල් රෙගුලාසි වලට අනුකූලව මූල්‍ය කටයුතු මෙහෙයවීම මෙම අංශය තුලින් සිදුවන ප්‍රධාන කාර්ය භාර්ය වේ.

### ආදායම් ඉලක්ක හා ප්‍රගතිය

2016 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත මුළු ආදායම් ඉලක්කය රුපියල් මිලියන 12,000 ක් වූ අතර, අදායම් ඉපයීමේ වර්ධනය සලකා බලා ආදායම් ඉලක්කය සංශෝධනය කරමින් රුපියල් මිලියන 15,000 දක්වා වැඩි කිරීමට මහාභාණ්ඩාගාරය විසින් කටයුතු කරන ලදී. ඒ අනුව 2016 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවමින් 2016 වර්ෂයේ උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 15,629 ක් විය. සංශෝධිත ආදායම ඉලක්කය ඉක්මවමින් රුපියල් මිලියන 629 ක අදායම් වර්ධනයක් වාර්තාකර ඇත. 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම හා සලකා බලන කල අදායමේ වර්ධනය සියයට 24.20 කි. එසේම 2015 වර්ෂය හා සැසදීමේදී 2016 වර්ෂයේ සියයට 54.63 ක ප්‍රශස්ථ අදායම් වර්ධනයක් වාර්තා කර ඇත. එම ආදායම් වර්ධනයට හේතු වී ඇත්තේ අපේක්ෂිත ප්‍රමාණයට වඩා සංචාරකයින්ගේ පැමිණීම වැඩිවීම හේතුවෙන් වීසා (ETA) නිකුත් කිරීම් වැඩිවීම සහ ද්විත්ව පුරවැසි සහතිකපත් නිකුතුව කඩිනම් සහ කාර්යක්ෂමව සිදු කිරීමත්ය.

2016 වර්ෂයේ දෙපාර්තමේන්තුව ප්‍රධාන ආදායම් මූලාශ්‍ර තුළින් උපයන ලද ආදායම් පහත පරිදි වේ.

| | ආදායම (රුපියල්) |
|---|---|
| ගමන් බලපත් නිකුත් කිරීම් හා සංශෝධන | 2,602,701,825.83 |
| විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් කටයුතු | 1,235,650,754.44 |
| තොටුපල කටයුතු | 65,763,000.00 |
| වීසා නිකුත් කිරීම්/ දීර්ඝ කිරීම් | 1,041,235,093.60 |
| විද්‍යුත් සංචරන වීසා වැඩසටහන (ETA) | 7,810,353,777.04 |
| පුරවැසි අංශය | 2,873,651,440.00 |
| එකතුව | 15,629,355,890.91 |



# <u>ආදායම් විශ්ලේෂණය 2012 – 2016</u>


| වර්ෂය | මුළු ගමන් බලපත් ආදයම | විදේශ දූත මණ්ඩල ආදයම් | තොටුපල | වීසා | විද්‍යුත් සංචරණ | පුරවැසි | මුළු ආදායම |
|---|---|---|---|---|---|---|---|
| 2011 | 2,064,103,335 | 963,519,650 | 35,885,000 | 595,177,260 | * | 105,972,500 | 3,764,657,745 |
| 2012 | 2,226,238,950 | 935,513,122 | 49,219,000 | 696,896,744 | 2,104,201,938 | 169,181,850 | 6,181,251,604 |
| 2013 | 2,092,488,502 | 1,062,648,099 | 71,397,000 | 751,379,693 | 3,510,925,846 | 35,253,730 | 7,524,092,870 |
| 2014 | 2,133,548,087 | 1,064,296,091 | 72,488,000 | 800,098,823 | 4,034,041,937 | 46,422,010 | 8,150,894,948 |
| 2015 | 2,104,719,692 | 1,027,633,544 | 74,065,000 | 917,471,394 | 5,133,896,060 | 850,008,800 | 10,107,794,490 |
| 2016 | 2,602,701,827 | 3,810,106.72 | 1,235,650,754 | 1,041,235,094 | 7,810,353,777 | 2,873,651,440 | 15,629,355,891 |


* විද්‍යුත් සංචරණ පද්ධතිය 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය.

## 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම (සංශෝධිත) හා තත්‍ය වියදම

2016 වර්ෂයේ දි දෙපාර්තමේන්තු වියදම් සඳහා ඇස්තමේන්තුගත (සංශෝධිත) ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 2,161.79 ක් විය. එයින් රුපියල් මිලියන 1045.28 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද රුපියල් මිලියන 1,116.47 ක් මූලධන වියදම් වෙනුවෙන්ද වෙන්කරන ලදී. 2016 වර්ෂයේ සමස්ථ තත්‍ය වියදම රුපියල් මිලියන 1,980.41 ක් වූ අතර එයින් රු.මිලියන 1,037.91 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද, රු.මිලියන 942.45 මූලධන වියදම් වෙනුවෙන්ද වැයකර ඇත.

# වියදම් සංයුතිය - 2016



# මූල්‍ය ප්‍රගතිය (වියදම්) -2016

| වියදම් වර්ගීකරණය | 2016<br>සංශෝධිත ඇස්තමේන්තුව | තත්‍ය වියදම | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| | | | |
| පුනරාවර්තන වියදම් | 1,045,279,000 | 1,037,909,000 | 99 |
| පුද්ගල පඩිනඩි | 558,066,000 | 557,185,000 | 100 |
| ගමන් වියදම් | 27,850,000 | 25,657,000 | 92 |
| සැපයීම් | 34,675,000 | 33,483,000 | 97 |
| නඩත්තු වියදම් | 128,593,000 | 128,329,000 | 100 |
| ගිවිසුම්ගත සේවා | 284,576,000 | 281,745,000 | 99 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 11,519,000 | 11,510,000 | 100 |
| මූලධන වියදම් | 1,116,469,000 | 942,454,000 | 84 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | 45,855,000 | 32,710,000 | 71 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 183,489,000 | 71,377,000 | 39 * |
| පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 4,000,000 | 1,237,000 | 31** |
| වෙනත් ආයෝජන | 883,125,000 | 837,130,000 | 95 |
| මුළු එකතුව | 2,161,748,000 | 1,980,363,000 | 92 |

* මිනුවන්ගොඩ රැඳවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමට එරෙහිව පැණනැඟුණු මහජන විරෝධතාවය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට සිදු වීම සහ කටුනායක මාණ්ඩලික නිළධාරී විවේකාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරිමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.

** 2016 වර්ෂයේ දෙපාර්තමේන්තුව "සුහුරුපාය" නව ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කිරීම නිසා සැලසුම් කල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

# 07. පුරවැසි අංශය

1948 අංක 18 දරණ පුරවැසි පනතින් පුරවැසි අංශය සඳහා ව්‍යවස්ථාපිත බලය ලැබී ඇත. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීමේ විධායක නිලබලය ලැබෙන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම්වරයාටය. පුරවැසි පනතේ ප්‍රතිපාදන සහ විධායක ක්‍රියාපටිපාටි ආගාමික හා විගාමික පනතින් පාලනය වන විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සමඟ ඍජුවම සම්බන්ධ වන නිසා පුරවැසි අංශය ආගමන හා විගමන දෙපාර්මේන්තුවේ ස්ථාන ගත කර ඇත. අමාත්‍යාංශ ලේකම්වරයාගේ විධායක බලතල සහකාර ලේකම්වරයෙකු මගින් ක්‍රියාත්මක වන අතර එම බලතල ද පුරවැසි අංශයේ නියෝජ්‍ය පාලකවරයකු මගින් ක්‍රියාත්මක වේ. සෙසු කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලකවරුන් | 02 |
| සංවර්ධන නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමණාකරන සහකාරවරුන් | 26 |
| කාර්යාල කාර්ය සහයකවරුන් | 05 |

**කාර්යභාරය:**

**පුරවැසි අංශය මඟින් 1948 අංක 18 දරණ පුරවැසි පනතේ ප්‍රතිපාදන පහත සඳහන් මූලික කරුණු ඔස්සේ ක්‍රියාත්මක කරයි.**

❖ **පනතේ 5(2) වගන්තිය යටතේ පුරවැසිභාවය ලියාපදිංචි කිරීම.**

එක් අයකු හෝ දෙදෙනාම ශ්‍රී ලාංකිකයන් වන දෙමව්පියන්ට දාව විදේශ රටවල උපත ලැබූ දරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

❖ **පනතේ 8 වන වගන්තිය යටතේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය නැවත ප්‍රදානය කිරීම.**

විදේශ රටක පුරවැසිභාවය ලබාගැනීම හේතුවෙන් ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහිමි වූ තැනැත්තන්ට නැවත ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අත්පත් කර ගැනීමට අදාල කටයුතු ඉටු කරනු ලබයි.

❖ **පනතේ 11 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.**

මව හෝ පියා ශ්‍රී ලාංකික වන 5(2) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම අවුරුදු 22 දක්වා ඉටු කර ගැනීමට අපොහොසත් වන තැනැත්තකු මෙම වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි.

❖ **පනතේ 12 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.**

ශ්‍රී ලාංකික කලත්‍රයකු ආවාහ කර ගන්නා විදේශීය කාන්තාවන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

- **<u>පනතේ 13 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.</u>**

සුවිශේෂී සමාජ සේවාවක් ඉටු කළ හෝ වෘත්තිමය, වාණිජමය කාර්මික හෝ කෘෂිකාර්මික අංශයන්හි නිපුනයෙකු වන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පුරවැසියකු වශයෙන් ජීවත්වීමේ අපේක්ෂාවෙන් පසුවන පුරවැසි පනතේ 11 වන වගන්තිය හා 12 වන වගන්තිය යටතේ පුරවැසිභාවය සඳහා හිමිකම් නොලබන තැනැත්තකු සඳහා ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

- **<u>පනතේ 13(අ) වන වගන්තිය අදාළ කටයුතු කිරීම.</u>**

වර්ෂ 5ක කාලයක් සඳහා වලංගු වීසා බලපත්‍රයක් හෝ පිටසනක් ප්‍රදානය කරනු ලැබ ඇති සහ විදේශ ආයෝජකයන් සහ වෘත්තිකයන් සඳහා ආණ්ඩුව විසින් අනුමත කරන ලද නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමයක ලියාපදිංචි කර ඇති යම් තැනැත්තෙකුට ලියාපදිංචියෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබාදීමට අදාල කටයුතු සිදු කරනු ලබයි.

- **<u>පනතේ 19 වන වගන්තිය පරිදි ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම.</u>**

19(2) මගින්, විදේශ රටවල පුරවැසිභාවය ලබාගැනීම හේතුවෙන් ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහිමි වු තැනැත්තකු එම රටවල පුරවැසිභාවය තිබියදීම ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

මෙහි 19(3) මගින් විදේශ රටවල වාස වීසා මගින් සිටින තැනැත්තන් සඳහා ශ්‍රී ලාංකික පුරවැසිභාවය තිබියදීම අදාල රට වෙත ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම.

- **<u>පනතේ 20 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.</u>**

20(1) වගන්තිය යටතේ 1948.11.15 දින හෝ එදිනට පෙර උපන් අයකු නම් සහ එම දිනය වන විට වෙනත් රටක ද පුරවැසියකු වන්නේ නම්, 1952.12.31 දින හෝ එම අයට වයස අවුරුදු 22ට පත්වන දින යන දින දෙකෙන් එම අය සම්බන්ධව පසුව එළඹෙන කවර වු දිනයෙහි වෙනත් රටෙහි පුරවැසිභාවය එකී රටෙහි නීතියට අනුව අත්හැර නියමිත නිලධාරියාට දන්වන්නේ නම් මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදු කරයි.


20(2) වගන්තිය යටතේ යම් පුද්ගලයකු පරම්පරාවෙන් ලංකාවේ පුරවැසියකු වන්නා වු සහ නීතිය ක්‍රියාත්මක වීමෙන්, ඔහුගේ උපත සිදු වු අවස්ථාවේ දී හෝ ඉන් පසුව යම් වෙනත් රටක පුරවැසියකු වන්නා වු විටක 1952.12.31 දින හෝ එලෙස වෙනත් රටක පුරවැසියකු වන්නා වු දින සිට වර්ෂයක් ගතවී එළඹෙන්නා වු දින හෝ වයස අවුරුදු 22 ට පත්වන දින යන දින වලින් එම අය සම්බන්ධයෙන් අන්තිමට එළඹෙන කවර දිනයක දී වෙනත් රටෙහි පුරවැසිභාවය එකී රටෙහි නීතියට අනුව අත්හැර නියමිත නිලධාරියාට දන්වන්නේ නම් මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසාන වීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.


20(3) වගන්තිය යටතේ පරම්පරාවෙන් ලංකාවේ පුරවැසියකු වන තැනැත්තකු ස්වේච්ඡාවෙන් වෙනත් රටක පුරවැසියකු වෙතොත් එම අයගේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අහෝසිවීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.

20(4) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය නැවත අයදුම්කරන අයකු විසින් ස්වකීය විදේශ රටෙහි පුරවැසිභාවය මාස 03ක් ඇතුලත අත්නොහරින්නේ නම් ඔහුගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහෝසි කිරීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.

**<u>පුරවැසි පනත අනුව 2016.01.01 සිට 2016.12.31 දක්වා නිකුත් කරන ලද සහතික</u>**

| වගන්තිය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | මුද්‍රණය කළ සහතික පත් සංඛ්‍යාව |
|---|---|---|
| 5(2) | 10254 | 8276 |
| 8 | 34 | 12 |
| 11 | 105 | 51 |
| 12 | 15 | 08 |
| 19(2)/ 19(3) | 14722 | 17544 |
| 20 | 108 | 108 |



**2016 වර්ෂය තුල ඉටු කරන ලද විශේෂිත කාර්යයන්, ජයග්‍රහණ හා අභියෝග**

- 1948 අංක 18 පනතේ 19 වගන්තිය යටතේ ද්විත්ව පුරවැසිභාවය ලබාදීම නව ක්‍රමවේදයක් යටතේ 2015.03.23 දින ආරම්භ කරන ලදී. ඒ අනුව 2016 වර්ෂය තුල බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ උත්සව 05ක් සහ සුහුරුපාය ගොඩනැගිල්ලේ පිහිටි ශ්‍රවණාගාරයේ දී උත්සව පවත්වා පිරිනමන ලද සහතිකපත් ප්‍රමාණය ඉහත දැක්වේ.

- 2016.10.13 වන දින කිලිනොච්චියේ දී පවුල් සංස්ථාව බලගැන්වීමේ ලිය ශක්ති වැඩසටහන පවත්වන ලද ජංගම සේවය සඳහා ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය මඟින් කරන ඉල්ලීම අනුව පුරවැසි අංශයේ නිලධාරින් සහභාගී වන ලදී.

- 2016.11.25 වන දින වව්නියාවේ දි ඉන්දියාවේ සිට පැමිණි ශ්‍රී ලාංකික සරණාගතයින් සඳහා පුරවැසිභාවය ලබාදීමේ ජංගම වැඩසටහන සඳහා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ , පුනරුත්ථාපන, නැවත පදිංචි කිරිම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය මඟින් කරන ඉල්ලීම අනුව පුරවැසි අංශයේ නිලධාරීන් සහභාගීවන ලදී.

# 8. අභ්‍යන්තර විගණන අංශය

ගණකාධිකාරී (අභ්‍යන්තර විගණක) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2016**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 02 |

## අරමුණු

- ✓ දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගීවී එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම.
- ✓ දෙපාර්තමේන්තුවට නියම කෙරුණු හෝ දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනා ක්‍රියාත්මක කිරීමේ හා සැලසුම් සහ වැඩසටහන් සපුරාලීමෙහිලා ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ගනන්දීමේ නිලධාරීයාට සහ ප්‍රගති අන්වේශන කමිටුවට සහාය වීම.
- ✓ උචිත අවස්ථා වලදී මෙම කර්තව්‍යයන්හි නිරත අයවලුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රගති අන්වේශන කමිටුව අතර සම්බන්ධ කාරකය වශයෙන් ක්‍රියාකිරීම.

## අභ්‍යන්තර විගණන කාර්යයන්

- ✓ වැරදි හා වංචා වැළැක්වීම සඳහා දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරිත්වය අතින් සාර්ථක දැයි සොයා බැලීම.
- ✓ ගිණුම් සහ වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- ✓ කාර්ය මණ්ඩලයට පවරා ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකතාව ඇගයීම.

- ✓ දෙපාර්තමේන්තුවේ වත්කම්, සියළුම ආකාරයේ අලාභ හානිවලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයා බැලීම.

- ✓ රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය විසින් සහ භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කර ඇති පරිපූරක උපදෙස් ද පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.

- ✓ නාස්තිය, නිස්කාර්ය ධාරිතාව සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරාගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- ✓ දෙපාර්තමේන්තුවේ ගිණුම් පරිපාටිය සහ කිසියම් මුදල් වැයවීමකට තුඩුදෙන එකී මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ දෙපරේතමේන්තුවේ දේපළ හා වත්කම ආරක්ෂාකාරී ලෙස අරපිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේදැයි සොයා බැලීම හා අවශ්‍ය අවස්ථා වලදී විශේෂ විමර්ශන පැවැත්වීම.
- ✓ ශිල්පය හෝ ගිණුම්කරණ දෘෂ්ඨිකෝණයෙන් බාහිරව කළමණාකරණ දෘෂ්ඨිකෝණයකින් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යයන් පරික්සා බැලිම සහ ඒ පිළිබඳ වාර්ථා කිරිම.
- ✓ වැඩ ,යෝජනා ක්‍රම සහ ව්‍යාපෘති වල ප්‍රගතිය සහ ඒ පිළිබඳ වැඩ සටහන් සහ කාල සටහන් කොතෙක් දුරට ඉලක්කයන් සාක්ෂාත් කර ගැන්ම කෙරෙහි යොමු විඇත්දැයි ඇගයීමක් කිරිම
- ✓ වැඩ ක්‍රියාත්මකවිම ප්‍රමාද විමට තුඩුදෙන ගැටළු කේෂ්ත්‍රයන් පිළිබඳ යාවත්කාලින ස්ථානික විමර්ෂණ පැවැත්විම.
- ✓ එවැනි මෙහෙයුම් කාර්යයන් අධික්ෂණය කිරිමෙහිලා භාවිතා කරනු ලබන පාලනයන් ඇගයිම හා සමාලෝචනය කිරිම.

**2016 වර්ෂය තුල ඉටු කරන ලද විශේෂිත කාර්යයන්**

ආගමන හා විගමන දෙපාර්තමේන්තු බත්තරමුල්ල නව ගොඩනැගිල්ල වෙත රැගෙන ඒම සඳහා වු කාර්යයට සක්‍රිය දායකත්වය.

**අභියෝග**

ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවිම

දිර්ඝ කාලයක් කාර්ය මණ්ඩලය අංශයේම රැදී නොසිටිම.

2016 වර්ෂයේ ඉලක්ක හා ප්‍රගතිය

දෙපාර්තමේන්තුව නව ගොඩනැගිල්ලට ගෙන ඒමේදි අභ්‍යන්තර විගණන සැලසුමට බාහිරවු කාර්යයන් වල නිරත වු , වර්ෂයේ අපේක්ෂිත කාර්යයන්ගෙන් 65% ක පමණ කාර්යයන් අවසන් කිරිමට හැකි විය.

## 09. සුභ සාධන කටයුතු

පැමිණෙන මහජනතාව හා බාහිර සමාජයේ සුබසිද්ධිය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුළින් සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටද සේවය ලබාගැනීමට පැමිණෙන මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමත් ප්‍රමුඛ කටයුතු වශයෙන් සිදුකරනු ලබයි.

| අනු අංකය | දිනය | වැඩසටහන |
|---|---|---|
| 01 | 2016.01.01 | නව අවුරුදු උත්සවය හා දෙපාර්තමේන්තුවේ ඵලදායි ලෙස සේවය කරන ලද කාර්ය මණ්ඩලය ඇගයීමට ලක් කර සම්මාන ප්‍රදානය කිරීම. |
| 02 | 2016.01.01 | 2016 වසරේ උපන්දින ත්‍යාගය වශයෙන් බිත්ති ඔරලෝසුවක් පිරිනැමීම. |
| 03 | 2016.01.08 | 2015 වසර නත්තල් උත්සවය වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන බිළිඳු හදට නත්තලක් වැඩසටහන පවත්වන ලද අතර එදින දිළිඳු පවුල්වල ළමුන් 50 දෙනෙකු සඳහා පාසල් උපකරණ, පාවහන් හා ද්‍රව්‍යමය ආහාර ලබාදීම සිදු කරනු ලැබිය. මෙහිදී කැරොල් ගී ගායනයෙන් නලින් පෙරේරා ප්‍රමුඛ මේරියන්ස් සංගීත කණ්ඩායම දායකත්වය ලබාදෙන ලදී. |
| 04 | 2016.01.21 | ප්‍රතිභා ප්‍රණාම 2016 ශිෂ්‍යත්ව ප්‍රධානෝත්සවය කොළඹ 05 සම්බුධත්ව ජයන්ති මන්දිර ශ්‍රවණාගාරයේදී ගරු අමාත්‍ය එස්.බී. නාවින්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සවශ්‍රීයෙන් පවත්වන ලදී. මෙහිදී 5 වසර ශිෂ්‍යත්වලාභින් 46 දෙනෙකු, සාමාන්‍ය පෙළ සමත් දරුවන් 35 දෙනෙකු, උසස් පෙළ විශ්ව විද්‍යාල වරම් ලැබූ දරුවන් 24 දෙනෙකු හා විශේෂ කුසලතා දැක්වූ දුවා දරුවන් 13 දෙනෙකු සඳහා සම්මාන සහතික හා මුදලින් ත්‍යාග ප්‍රදානය කරන ලදී. ශිෂ්‍යත්ව සඳහා රු. 1,078,000/- ක මුදලක් වැය කරන ලදී |
| 05 | 2016.07.30 | දෙපාර්තමේන්තු කණ්ඩායම් අතර සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය පැලවත්ත බුද්ධදාස ක්‍රීඩාංගණයේ පවත්වන ලදී. මෙහි කාන්තා ශූරතාව පරිගණක අංශ කණ්ඩායම ද පිරිමි ශූරතාව බලයලත් නිලධාරීන්ගේ කණ්ඩායම දිනා ගන්නා ලදී. |
| 06 | | කොළඹ හා අවට ප්‍රදේශවල ඇති වූ ගංවතුරින් විපතට පත් ජනතාව වෙනුවෙන් වියළි ආහාර, ද්‍රව්‍යමය ආධාර සහ සකස් කළ ආහාර දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ද ආධාර ඇතිව දින කිහිපයක් බෙදා දීමට කටයුතු කරන ලදී. ඒ සඳහා කොළොන්නාව, කඩුවෙල, රණාල, නවගමුව හා මල්වාන ප්‍රදේශ යොදා ගන්නා ලදී. |
| 07 | | ගංවතුරින් හානී සිදු වූ දෙපාර්තමේන්තු අප සාමාජිකයින් හට ඔවුන්ගේ හානියේ ස්වභාවය සලකා සුභසාධක සංගමයේ අරමුදලින් රු. 330,000/- ක් බෙදා දීමට කටයුතු කරන ලදී. |
| 08 | 2016.07.01 | දෙපාර්තමේන්තුව බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කිරීමේදී අප කාර්ය මණ්ඩලය සඳහා ආපනශාලාව 7 වන මහලේ පිහිටුවීමට ඉඩ කඩ වෙන් කර තිබූ බැවින් එය ඉතා |

| | | |
|---|---|---|
| | | අලංකාර දැකුම්කළු ස්ථානයක් බවට පත්කිරීමට කටයුතු කිරීම. මේ සඳහා සුභසාධක සංගමයේ අරමුදලින් රු. 3,000,000/-ක පමණ මුදලක් වැය කරන ලදී. |
| 09 | 2016.07.01 | සුහුරුපාය ප්‍රධාන ගොඩනැගිල්ලට යාබද ගොඩනැල්ලෙහි ආපනශාලාව සඳහා ආහාර සකස් කිරීමට ලබාදුන් කොටස සෞඛ්‍ය ආරක්ෂිතව ආහාර සකස් කළ හැකි පරිදි අංග සම්පූර්ණ මුළුතැන්ගෙයක් සකස් කරන ලදී. මේ සඳහා සුභසාධක සංගමයේ අරමුදලින් රු. 1,000,000/-ක පමණ මුදලක් වැය කරන ලදී. |
| 10 | 2016.07. | දොපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ගීත ගායනා කළ ගුවන් විදුලි සංස්ථාවේ සේවක සංග්‍රහය වැඩසටහන පටිගත කිරීම ආපනශාලාවේදී සිදු කිරීම. |
| 11 | 2016.08.01 | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය හා පැමිණෙන සේවාලාභින් හට පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා ආපනශාලාවද ඇතුළුව මහල් 7 තුළම ජල පෙරණ සවිකිරීමට කටයුතු කිරීම. මේ සඳහා රු. 475,000/- ක මුදලක් වැය කරන ලදී. |
| 12 | 2016.08.25 | දෙපාර්තමේන්තුවට සේවාලාභින් පිවිසෙන පියස ගොඩනැගිල්ල තුළ පාලක ජනරාල්තුමාගේ උපදෙස් පරිදි ඡායාරූප සේවා, ඡායා පිටපත් සේවා, කුරියර් සේවා, අයදුම්පත් පරිගණක ආශ්‍රයෙන් පිරවීමේ සේවාව හා මහජනතාවට රැඳී සිටීමට ආසන 300 ක් යෙදවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව පියස තුළ රිසිට්පත් නිකුත් කිරීමේ කවුළු 06 ක්, පිළිගැනීමේ කවුළු, අයදුම්පත් නිකුත් කිරීමේ කවුළු, රූපවාහිනි යන්ත්‍ර හා කෙටි ආහාර අලෙවි සැලක් ද ඇති කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම එතුළ සකස් කරන ලද සියලු කුටි එකම ප්‍රමාණයකට අලංකාරවත්ව සකස් කිරීමට කටයුතු කරන ලදී. පියස පරිශ්‍රය නිර්මාණය වෙනුවෙන් රු.5,615,000/-ක මුදලක් වැය කරන ලදී. |
| 13 | 2016.08.29 | දෙපාර්තමේන්තුවේ අලංකාරය සඳහා මල් බඳුන් තැබීමට කටයුතු කිරීම. |
| 14 | 2016.09. | සාමාජිකයන්ගේ පහසුව සඳහා වැඩි ඉඩකඩ සහිතව, කියවීමේ පහසුකම් සහිව පුස්තකාලය සකස් කිරීමට කටයුතු කිරීම. ඒ සඳහා රු. 1,500,000/- මුදලක් වැය කරන ලදී. 2016 වර්ෂය සඳහා පුස්තකාලයට පොත් මිලදී ගැනීම වෙනුවෙන් රු. 320,000/- මුදලක් වැය කරන ලදී. |
| 15 | 2016.12.22 | 2016 වසර නත්තල් උත්සවය වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන බිලිඳු හදට නත්තලක් වැඩසටහන පවත්වන ලද අතර එදින දිලිඳු පවුල් වල ළමුන් 50 දෙනකු සඳහා පාසල් උපකරණ පාවහන් හා ද්‍රව්‍යමය ආහාර ලබාදීම සුහුරුපාය පියස පරිශ්‍රයේ දී සිදු කරනු ලැබීය. මෙහිදී කැරොල් ගී ගායනයෙන් නලින් පෙරේරා ප්‍රමුඛ මේරියන්ස් සංගීත කණ්ඩායම දායකත්වය ලබාදෙන ලදී. |
| 16 | 2016.12.29 | 2016 වසර තුළ ස්ථානමාරුවී ගිය නිලධාරීන් හා වාර්ෂික ස්ථාන මාරුවී යන නිලධාරීන් සඳහා උපහාර උත්සවයක් පැවැත්වීම. |
| 17 | 2016.12.30 | වර්ෂ අවසාන “සතුටු සාජ්ජය” සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේදී පවත්වන ලදී. |